**253 වන කාණ්ඩය - 06 වන කලාපය**
**தொகுதி 253 - இல. 06**
**Volume 253 - No. 06**

**2017 ජූලි 26 වන බදාදා**
**2017 யூலை 26 புதன்கிழமை**
**Wednesday, 26th July, 2017**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

කථානායකතුමාගේ සහතිකය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ත්‍රි රෝද රථ රියැදුරන්ට එරෙහි පැමිණිලි

**ඛනිජ තෙල් වෘත්තීය සමිති වර්ජනය:**

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමු වන වර කියවන ලදී

**විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත:**

නියමය

**රේගු ආඥාපනත:**

යෝජනාව

**ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන ) පනත් කෙටුම්පත:**

දෙවන වර හා තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள் :**

சபாநாயகரது சான்றுரை

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல்மூல வினா:**

முச்சக்கரவண்டிச் சாரதிகளுக்கெதிரான முறைப்பாடுகள்

**பெற்றோலியத் தொழிற்சங்கங்களின் வேலைநிறுத்தம்:**

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரின் கூற்று

**மாகாண சபைத் தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம் :**

முதன்முறை மதிப்பிடப்பட்டது

**விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் :**

கட்டளை

**சுங்கக் கட்டளைச் சட்டம் :**

தீர்மானம்

**நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம் :**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Complaints Against Three-Wheeler Drivers

STRIKE ACTION BY TRADE UNIONS OF CEYLON PETROLEUM CORPORATION:

Statement by Prime Minister, Minister of National Policies and Economic Affairs

PROVINCIAL COUNCILS ELECTIONS (AMENDMENT) BILL:

Read the First time

SPECIAL COMMODITY LEVY ACT:

Order

CUSTOMS ORDINANCE:

Resolution

NATION BUILDING TAX (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2017 ජූලි 26 වන බදාදා*
*2017 யூலை 26 புதன்கிழமை*
*Wednesday, 26th July, 2017*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 ජූලි 25 දින මවිසින් "ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2017 ජූලි මස 26වන බදාදා, එනම් අද දින අපර භාග 2.30ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව, 2017 ජූලි 25 දිනැති අංක 2029/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.-[ ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුක්රේනය අතර උද්ර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 02 දිනැති අංක 2021/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

එම නියමය ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්ෂික ප්‍රගති වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, අග්නිදිග විශ්වවිද්‍යාලයේ කලා සහ සංස්කෘතික පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අංශය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය ලෙස උසස් කිරීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 ජූනි 14 දිනැති අංක 2023/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය තුළ ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශයක් සහ පරපෝෂවේදී අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 ජූනි 14 දිනැති අංක 2023/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨය තුළ ජාත්‍යන්තර අධ්‍යයන අංශයක්, සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශයක් සහ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 ජූනි 14 දිනැති අංක 2023/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මම ඉදිරිපත් කරමි.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟට, ගරු වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා.

ගරු ඇමතිතුමනි, සභාවේ අවසරය ඇතිව ගිවිසුම් කෙටුම්පත අද ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කිරීම සම්බන්ධවත්, ද්‍රවිඩ සහ සිංහල භාෂාවලින් සිකුරාදා දින ඉදිරිපත් කිරීම සම්බන්ධවත් ඊයේ සාකච්ඡා කළා.

**ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, මම හිතන්නේ අපට අද දවස ඇතුළත එම පිටපත් දෙන්න බොහෝ දුරට පුළුවන්කම තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම හොඳයි.

**ගරු මහින්ද සමරසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
නැත්නම් හෙට දිනයේදී අනිවාර්යයෙන්ම දෙන්න පුළුවන්. මේ වනකොටත් එය පරිවර්තනය කරමින් පවතිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

හම්බන්තොට වරාය සම්බන්ධයෙන් අවසර ලබාදීමේ ගිවිසුම් කෙටුම්පත.- [මහින්ද සමරසිංහ මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

එම වාර්තා තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් නියෝග සම්බන්ධයෙන් ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 05 දිනැති 2017/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය ඉදිරිපත් කරමි.

එම නියෝගය තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වජිර අබේවර්ධන මහතා - පැමිණ නැත.

**ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)
ගරු කථානායකතුමනි, අඹන්පොල, බක්මීවැව, වීරසෝලය යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. සරත් නන්දසිරි බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication and Digital Infrastructure)
ගරු කථානායකතුමනි, කැප්පෙට්ටිපොල, වැවේවත්ත, "විජය" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. යසපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ගරු කථානායකතුමනි, කොළඹ - 08, බොරැල්ල, මැගසින් පාර, අංක 23/64 දරන ස්ථානයෙහි පදිංචි ඒ. රංජිත් විජේසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් පහ මම පිළිගන්වමි.

(1) වැලිගල්ල, කොටකේදෙනිය පාර, අංක 130 දරන ස්ථානයෙහි පදිංචි අරඹේගෙදර සංජීව රවීන්ද්‍ර රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සම;

[ගරු ලකී ජයවර්ධන මහතා]

(2) හන්දෙස්ස, ඉඹුල්දෙනිය, අංක 1 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.ටී.බී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මහනුවර, මොරගොල්ල, ශ්‍රියාගම, අංක 14 දරන ස්ථානයෙහි පදිංචි පී. කෝනාර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) අඹගහපැලැස්ස, 6 කනුව, අංක 17/2 දරන ස්ථානයේ පදිංචි ටී.ජී. සයිමන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) උඩිස්පත්තුව, පොද්දල්ගොඩ, වාසල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ජී.වයි.ටී. වාසල බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයේ, කුලියාපිටිය මානව සම්පත් ඒකකයේ සේවය කරන එස්. සුදත් ජයවීර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, මාතලේ, හුලංගමුව පාර, අංක 254 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා - පැමිණ නැත.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් තුන මම පිළිගන්වමි.

(1) තෙලිජ්ජවිල, කිරිමැටිමුල්ල, අලස්වත්ත, සපුමල් මාවත, අංක 65/25/ඒ දරන ස්ථානයෙහි පදිංචි ජේ.පී.පී. මනෝහාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) කඹුරුගමුව, කනත්තේගොඩ, බෝගහවත්ත යන ලිපිනයෙහි පදිංචි එල්.කේ. ඉරේෂා චාන්දනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පුහුල්වැල්ල, කන්දෙවිහාර පාර, අලුත් ගෙදර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**
(மாண்புமிகு நாலக்க பிரசாத் கொலொன்னே)
(The Hon. Nalaka Prasad Colonne)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, අලුත්වැව අංක 138/2 දරන ස්ථානයෙහි පදිංචි එඩ්වඩ් පොන්නම්පෙරුම මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්මි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, රත්මලාන, රජමාවත පාර, අංක 9/3 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.කේ. ලක්ෂ්මන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, රඹුක්කන, යටගම, පුවක්මොටේ, අංක ඊ 78/1 දරන ස්ථානයෙහි පදිංචි එච්.ආර්. හීන්බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 - 976/'16-(3), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අද මේ ප්‍රශ්නය අහන්නේ තුන්වන වතාවටයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, මෙම ප්‍රශ්නය අහන තුන්වන අවස්ථාව නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න වෙයි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## "රාවණා ලංකේශ්වර" ටෙලි නාට්‍යය විකාශය නවතා දැමීම: හේතු
## "ராவணா லங்கேஷ்வர" தொலைக்காட்சி நாடக ஒளிபரப்பு நிறுத்தம்: காரணம்
### HALT OF TELECASTING "RAVANA LANKESHWARA" TELEDRAMA: REASONS

1044/'16

**2. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සිංහල හඬ කවා "රාවණා ලංකේශ්වර" නමින් ඉන්දියානු ටෙලි නාට්‍යයක් ස්වාධීන රූපවාහිනී නාලිකාවේ විකාශය කළ බවත්;

(ii) 2016 අගෝස්තු මාසයේ සිට එකී ටෙලි නාට්‍යය විකාශය කිරීම හදිසියේ අතරමැද නවතා දමා ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) එම ටෙලි නාට්‍යය විකාශය කිරීම හදිසියේ නවතා දැමීමට බලපෑ හේතු කවරේද;

(ii) එය යළි විකාශය කිරීම ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிங்கள ஒலி ஊட்டப்பட்ட "ராவணா லங்கேஷ்வர" எனும் இந்திய தொலைக்காட்சி நாடகமொன்று சுயாதீன தொலைக்காட்சி அலை வரிசையில் ஒளிபரப்பப்பட்டதென்பதையும்;

(ii) 2016 ஆகஸ்ட் மாதம் தொடக்கம் திடீரென இத்தொலைக்காட்சி நாடகத்தின் ஒளிபரப்பு இடைநடுவில் நிறுத்தப்பட்டுள்ளது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) இத்தொலைக்காட்சி நாடகத்தின் ஒளிபரப்பைத் திடீரென நிறுத்துவதில் செல்வாக்குச் செலுத்திய காரணங்கள் யாவை;

(ii) அதன் ஒளிபரப்பை மீண்டும் ஆரம்பிப்பதற்கு எதிர்பார்க்கப்படுகின்ற திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media :

(a) Will he admit that -

(i) an Indian teledrama that had been dubbed in Sinhala under the title "Ravana Lankeshwara" was telecast on Independence Television Network; and

(ii) telecasting of the aforesaid teledrama has suddenly been stopped halfway since August, 2016?

(b) Will he inform this House -

(i) the reasons as to why telecasting of the aforesaid teledrama was suddenly stopped halfway; and

(ii) the date from which telecasting of the aforesaid teledrama will be recommenced?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) කොටස් 154කින් යුක්ත වූ රාවණා නාට්‍යයේ එක් කොටසක් ඇමෙරිකන් ඩොලර් 450ක මුදලකට මිලදී ගැනීමට 2016 පෙබරවාරි 25වන දා ස්වාධීන රූපවාහිනියේ වැඩසටහන් සහ නිෂ්පාදන සේවා මිලදී ගැනීමේ කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව මුළු කොටස් ගණන සඳහා සම්පූර්ණ වියදම ඇමෙරිකන් ඩොලර් 69,300කි.

ඊට අමතරව විකාශය කිරීම සඳහා ආනයනික ටෙලි නාට්‍ය බද්ද, හඬ කැවීම් ගාස්තු සහ ගුවන් කාලය වෙනුවෙන් එක් කොටසකට රුපියල් 230,000ක මුදලක් ද වියදම් විණි.

2016 මැයි 03වන දා සිට විකාශය ආරම්භ කෙරිණි. නමුත්, නාට්‍ය සඳහා වෙළෙඳ දැන්වීම් ඔස්සේ ආදායම් නොලැබුණි. නැරඹුම් අගයන් (viewer ratings) ප්‍රේක්ෂක ප්‍රතිචාරයන්ද පැවතුණේ ඉතා අවම මට්ටමකය.

"රාවණා" ටෙලි නාට්‍ය මාලාව නිර්මාණයක් ලෙස දුර්වල බවත්, ළමුන් සඳහා එහි අධ්‍යාපන වටිනාකමක් නොමැති බවත් එවකට පැවැති පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ටෙලි නාට්‍ය ඇගැයීම් මණ්ඩලය විසින් දැනුම් දී තිබුණි.

මේ සියලු කරුණු සැලකිල්ලට ගෙන කොටස් 61කින් පසු රාවණා ටෙලි නාට්‍ය විකාශය කිරීම නවතා දැමීමට වැඩසටහන් හා නිෂ්පාදන සේවා මිලදී ගැනීමේ කමිටුව 2016 ජූලි 13වෙනි දින තීරණය කරන ලදී.

(ii) මෙම නාට්‍ය නැවත විකාශය කිරීමට බලාපොරොත්තුවක් නැත.

(ඇ) පැන නොනඟී.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව ඉන්දියාවේ නිර්මාණය කළ මේ ඓතිහාසික වැදගත්කමක් ඇති නාට්‍ය අධ්‍යාපනික වටිනාකමක් නැතැයි යනුවෙන් ස්වාධීන රූපවාහිනී සේවය තීරණය කළේ කුමන පදනමකින්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ සම්බන්ධ කොමිටියක් තිබුණා. ඒ කොමිටිය විසින් අවශ්‍ය දේවල් ගැන සොයා බලා තමයි ඒ තීරණය කළේ. ඒ වාගේම, මේකට ratings තිබුණේත් නැහැ; වෙළෙඳ දැන්වීම් ලැබුණේත් නැහැ. එතකොට ඉතින් එහෙම තමයි වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන සහ අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු ඇමතිතුමනි, රාජ්‍ය මාධ්‍ය ආයතන ටෙලි නාට්‍යයක අධ්‍යාපනික වටිනාකමක් නැතැයි තීරණය කිරීමට භාවිත කරන නිර්ණායක කවරේදැයි මේ ගරු සභාවට දැනුම් දෙන්නේද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අපට පුළුවනි ඒ ගැන ඔබතුමාට පසුව දැනුම් දෙන්න. [බාධා කිරීමක්]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, පසුව දැනුම් දෙනවා කියලා පාර්ලිමේන්තුවට කිව්වාට, නිශ්චිත දිනයක් තිබෙන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

තොරතුරු තිබුණා නම් අදම දෙන්න තිබුණා. අපි ඒක ලබා දෙන්නම්. ඒක විනිවිදභාවයකින් යුතුවයි සිද්ධ වෙන්නේ. අපේ රජය බලයට පත් වෙන්න ඉස්සෙල්ලා ටෙලි නාට්‍ය විකාශය කළ විධිය ඔබතුමා දන්නවා. එක එක්කෙනාට කීයක් ගෙවන්න වුණාද? අපි ඒවා ඔක්කොම නැති කළා. රුපියල් පණස්දහසක් වාගේ ගෙවන්න වුණා එක කොටසකට.

## රජයේ ගොඩනැඟිලිවල පවත්වාගෙන යන අමාත්‍යාංශ: කොළඹ මහනගර සභා බලප්‍රදේශය
## அரச கட்டிடங்களில் இயங்கும் அமைச்சுக்கள்: கொழும்பு மாநகரசபை ஆளுகைப் பிரதேசம்
## MINISTRIES FUNCTIONING IN STATE-OWNED BUILDINGS: COLOMBO MUNICIPAL LIMITS

1050/'16

**3. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කොළඹ මහනගර සභා බලප්‍රදේශය තුළ පිහිටි රජයේ ගොඩනැඟිලිවල පවත්වාගෙන යන අමාත්‍යාංශ කවරේද;

(ii) එම අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන රජයේ ගොඩනැඟිලි කවරේද;

(iii) එම අමාත්‍යාංශ අතරින් බදු කුලී ගෙවන හා නොගෙවන අමාත්‍යාංශ, එක් එක් ගොඩනැඟිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බදු ගෙවනු ලබන අමාත්‍යාංශ, වර්ග අඩියක් සඳහා ගෙවනු ලබන බදු කුලී හා සේවා ගාස්තුව, එක් එක් ගොඩනැඟිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ගොඩනැඟිලිවල රථ ගාල් කිරීම සඳහා ඇති ඉඩ ප්‍රමාණවලට ගෙවීමක් සිදු කරන්නේද;

(vi) එසේ නම්, එම මුදල කොපමණද;

(vii) රථ සංඛ්‍යාව අනුව සිදු කරන එම ගෙවීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாநகரசபை ஆளுகைப் பிரதேசத்தில் உள்ள அரசாங்க கட்டிடங்களில் பேணிவரப்படுகின்ற அமைச்சுக்கள் யாவை என்பதையும்;

(ii) இவ்வமைச்சுக்கள் பேணிவரப்படும் அரசாங்க கட்டிடங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அமைச்சுக்களில் குத்தகைக் கூலி செலுத்தும் மற்றும் செலுத்தாத அமைச்சுக்கள், ஒவ்வொரு கட்டிடத்திற்கு அமைவாக தனித்தனியே யாவை என்பதையும்;

(iv) குத்தகை செலுத்தும் அமைச்சுக்கள், ஒரு சதுர அடிக்கு செலுத்தும் குத்தகைக் கூலி மற்றும் சேவை கட்டணம், ஒவ்வொரு கட்டிடத்திற்கு அமைவாக தனித்தனியே எவ்வளவு என்பதையும்;

(v) இக்கட்டிடங்களில் வாகனங்களை நிறுத்தி வைப்பதற்காக உள்ள இடப்பரப்புக்கு கொடுப்பனவுகள் செய்யப்படுகின்றதா என்பதையும்;

(vi) ஆமெனின், இத்தொகை யாதென்பதையும்;

(vii) வாகனங்களின் எண்ணிக்கைக்கு அமைவாக மேற்கொள்ளப்படும் மேற்படி கொடுப்பனவு முறைமை யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he state -

(i) the Ministries that run their offices in state-owned buildings within the limits of Colombo Municipal Council area;

(ii) the State-owned buildings, in which aforesaid offices of the Ministries have been located;

(iii) separately, in terms of each building , the ministries that pay lease and do not pay lease;

(iv) separately, in terms of each building, amount of lease and service charges, paid per one square foot, by aforesaid Ministries;

(v) whether a fee is charged for the parking spaces of this buildings;

(vi) if so, aforesaid amount; and

(vii) the method of payments that is calculated in terms of the number of vehicles?

(b) If not, why?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඇමුණුමෙහි දැක්වේ.

(ii) ඇමුණුමෙහි දැක්වේ.

(iii) ඇමුණුමෙහි දැක්වේ.

(iv) ඇමුණුමෙහි දැක්වේ.

(v) රථගාල් සඳහා ගෙවීමක් සිදු කරනු නොලැබේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

ඇමුණුම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

| අනු අංකය | අමාත්‍යාංශයේ නම | එම අමාත්‍යාංශ පවත්වා ගෙන යනු ලබන රජයේ ගොඩනැඟිලි | බදු කුලී ගෙවන්නේද යන වග | ගෙවනු ලබන ගාස්තු (වර්ග අඩියක් සඳහා) | |
|---|---|---|---|---|---|
| | | | | බදු මුදල (රු) | සේවා ගාස්තු (රු) |
| 01 | කම්කරු, වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | කම්කරු දෙපාර්තමේන්තුව | නැත | - | - |
| 02 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | මහා භාණ්ඩාගාරය | නැත | - | - |
| 03 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | තැපැල් දෙපාර්තමේන්තුව | නැත | - | - |
| 04 | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | නැත | - | - |
| 05 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය එම අමාත්‍යාංශය | නැත | - | - |
| 06 | ආරක්ෂක අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 07 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 08 | විදේශ කටයුතු අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 09 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 1.ආහාර හා සමූපකාර අංශය සතොස 2.එම අමාත්‍යාංශය 3.කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | ගෙවනු ලැබේ නැත නැත | 100.00 | නැත |
| 10 | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ගෙවනු ලැබේ | 18.70 | නැත |
| 11 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | වරාය අධිකාරිය | ගෙවනු ලැබේ | 41.00 | නැත |
| 12. | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | ගෙවනු ලැබේ | 111.17 | |
| 13 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය තුළ සහ/බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව | නැත (කොටසක් සඳහා ගෙවනු ලැබේ) | - 281.10 | - |
| 14 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 15 | බුද්ධ ශාසන අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 16 | ක්‍රීඩා අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 17 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 18 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ආහාර දෙපාර්තමේන්තුව | | නැත | - | - |
| 19 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 20 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 21 | අධිකරණ අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 22 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |
| 23 | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | එම අමාත්‍යාංශය | නැත | - | - |

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

කොළඹ මහ නගර සහා බල ප්‍රදේශයේ තිබෙන රජයේ ගොඩනැඟිලි ශ්‍රී ජයවර්ධනපුර අගනුවරට ගෙන ඒමේ වැඩ පිළිවෙළ යටතේ, ඇමතිතුමා සඳහන් කළ ගොඩනැඟිලි කොපමණ කාලයක් තුළ ශ්‍රී ජයවර්ධනපුර අගනුවරට ගෙන ඒමටද ඔබතුමන්ලාගේ ජාතික ප්‍රතිපත්තිය අනුව සැලසුම් කරලා තිබෙන්නේ?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ සමයේ මේ පිළිබඳව ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ තවම අඛණ්ඩව ඉදිරියට ගෙන යනවා. මේ ප්‍රදේශයේ තවත් ගොඩනැඟිලි සෑදීමට අපට තව කාලයක් ගත වෙනවා. ඔබතුමා දන්නවා තිබෙන මුදල් ප්‍රමාණයට අනුව තමයි වැඩ කටයුතු කෙරෙන්නේ කියලා. මේ වන විටත් ගොඩනැඟිලි විශාල ප්‍රමාණයක් ඉදි වෙමින් පවතිනවා. ඒ සැලැස්මට අනුව තමයි අපට ඉදිරියට යන්න වෙලා තිබෙන්නේ. කාලයෙන් කාලයට මුදල් තිබෙන විධියට ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ සැලැස්මේ තිබුණා, කොළඹ කොටුවෙන්, මරදානෙන් හෝ දෙමටගොඩින් ආරම්භ වෙලා ශ්‍රී ජයවර්ධනපුර දක්වා පැමිණීමට දුම්රිය මාර්ගයක් ඉදි කිරීමට. ගරු කථානායකතුමනි, මා හිතන විධියට ප්‍රධාන දුම්රිය ස්ථානයක් හෝ දුම්රිය මාර්ගයක් නැති ලෝකයේ එකම අගනුවර තමයි ශ්‍රී ජයවර්ධනපුර අගනුවර. ඇත්තටම අපි රටක් විධියට ඒ පිළිබඳව ලජ්ජා වෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ප්‍රධාන දුම්රිය ස්ථානයක් හෝ දුම්රිය මාර්ගයක් නැති ලෝකයේ තිබෙන එකම අගනුවර තමයි ශ්‍රී ජයවර්ධනපුර අගනුවර.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට අදාළයි. ගොඩනැඟිලි හැදුවාට වැඩක් නැහැ නේ ඒවායෙහි වැඩ කරන අයට ගමන් කරන්න මෙවැනි දුම්රිය මාර්ගයක්වත් නැත්නම්. ගරු කථානායකතුමනි, ඒ නිසා සම්බන්ධයක් තිබෙනවා. රජයේ ගොඩනැඟිලි මෙම ප්‍රදේශයේ හැදුවාම, ඒ රජයේ සේවකයන්ට එන්න-යන්න දුම්රිය මාර්ගයක් තිබෙන්න එපා යැ. සම්බන්ධයක් නොවෙයි, අවියෝජනීය බැඳීමක් තිබෙන්නේ; වෙන් කළ නොහැකි බැඳීමක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, කියන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අපි record එකක් තියලා තිබෙනවා, දුම්රිය ස්ථානයක් නැති ලෝකයේ තිබෙන එකම අගනුවර විධියට. ඒක ලෝක වාර්තාවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගොඩනැඟිලි විතරක් හැදුණාට වැඩක් නැහැ. ගරු කථානායකතුමාත් මේ මාර්ග තදබදය නිසා පීඩා විඳිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට නම් කමක් නැහැ, ඒකට. ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න කෝ.

ඔබතුමාට අතරු ප්‍රශ්නයක් නැද්ද? ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මේ මාර්ග තදබදය ඉවත් කරන්න ඉහළින් සැහැල්ලු මාර්ග හෝ පහළින් දුම්රිය මාර්ග පද්ධතියක් හෝ ඇති කරන්න ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සැලසුම් අතර තිබෙනවාද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අපි ජපන් රජයේ ආධාරත් එක්ක ඒ වැඩ පිළිවෙළ දැනටමත් ක්‍රියාත්මක කරමින් පවතිනවා. අනිවාර්යයෙන්ම බත්තරමුල්ලේ ඉඳලා කොටුව සහ අනෙකුත් ප්‍රදේශ සම්බන්ධ වෙන දුම්රිය මාර්ග හයක් ක්‍රියාත්මක කරන්න දැනටම සැලසුම් කරලා ඒවා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ වාගේම, කැලණිය පාලමේ ඉඳලා අධිවේගී මාර්ගය මේ ප්‍රදේශයට -බත්තරමුල්ල ප්‍රදේශයට- ගෙන ඒමටත් අපි දැන් සැලසුම් කරලා ක්‍රියාත්මක කරගෙන යනවා.

## මතුගම වලගෙදර මහා විද්‍යාලය: පහසුකම්
### மத்துகம வலகெதர மகா வித்தியாலயம் : வசதிகள்
### MATUGAMA WALAGEDARA MAHA VIDYALAYA: FACILITIES

1154/'16

**5. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මතුගම අධ්‍යාපන කලාපයට අයත් බප/මතු/ වලගෙදර මහා විද්‍යාලය 2012 වර්ෂයේ ද්විතීයික පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කළද එම පාසල සඳහා ලැබී ඇත්තේ තාක්ෂණ විද්‍යාගාරයක් පමණක් බවත්;

(ii) 2016 වර්ෂයේදී එම පාසල "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියේ "සී" කාණ්ඩයට ඇතුළත් කළද, ඒ යටතේ අලුතින් කිසිදු පංති කාමර ගොඩනැඟිල්ලක් ලබා නොදුන් බවත්;

(iii) පසු ගිය වසර 15 තුළම මෙම පාසල සඳහා ප්‍රමාණවත් භෞතික සම්පත් ලැබී නොමැති බවත්;

(iv) පාසලේ සංගීතය, විද්‍යාව, ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාස සහ උපදේශනය යන විෂයයන් සහ 6 - 9 වැනි ශ්‍රේණිවලට දෙමළ විෂය ඉගැන්වීමට ගුරුවරුන් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සිසුන් 1200 පමණ ඉගෙනුම ලබන මෙම පාසලට ප්‍රමාණවත් ගොඩනැඟිලි ලබා දීමට කටයුතු නො කරන්නේ මන්ද;

(ii) එම පාසලේ පවතින ගුරු පුරප්පාඩු පිරවීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்துகம கல்வி வலயத்துக்குரிய மேமா/மத்து/ வலகெதர மகா வித்தியாலயம் 2012ஆம் ஆண்டில் இரண்டாம் நிலை பாடசாலை கருத்திட்டத்தில் சேர்க்கப்பட்டபோதிலும் அப்பாடசாலைக்கு தொழில்நுட்பவியல் கூடமொன்று மாத்திரமே கிடைத்துள்ளதென்பதையும்;

(ii) 2016ஆம் ஆண்டில் அப் பாடசாலை "அண்மித்த பாடசாலை சிறந்த பாடசாலை" கருத்திட்டத்தின் `சீ' வகுதிக்குள் உள்ளடக்கப்பட்டபோதிலும், அதன்கீழ் புதிதாக எந்தவொரு வகுப்பறை கட்டிடமும் வழங்கப்படவில்லை என்பதையும்;

(iii) கடந்த 15 ஆண்டுகளாக இப்பாடசாலைக்கு போதியளவு பௌதிக வளங்கள் கிடைக்கவில்லை என்பதையும்;

(iv) பாடசாலையில் சங்கீதம், விஞ்ஞானம், விளையாட்டு மற்றும் உடற்பயிற்சி, ஆலோசனை ஆகிய பாடங்களையும் 6 - 9 ஆம் தரங்களுக்கு தமிழ் மொழியையும் கற்பிப்பதற்கு ஆசிரியர்கள் இல்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்கின்றாரா?

(ஆ) (i) சுமார் 1200 மாணவர்கள் கல்வி கற்கின்ற இப் பாடசாலைக்கு போதியளவு கட்டிட வசதிகளைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி பாடசாலையில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he admit that -

(i) although the බප/මතු/Walagedara Maha Vidyalaya was included in the secondary school development project in year 2012, it has only received a technology laboratory;

(ii) although the school was included in the ‘C’ category of the project “Nearest School - The Best School” project in year 2016, it was not provided with any classroom building;

(iii) this school has not received adequate physical resources in the last 15 years; and

(iv) there are no teachers to teach subjects such as Music, Science, Sports and Physical Education and counseling and no teachers to teach Tamil to grade 6 to 9 classes?

(b) Will he inform this House -

(i) the reason for not providing required number of buildings for this school where 1200 students are studying;

(ii) the time that will take to fill the teacher vacancies of the school?

(c) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට අදාළ පිළිතුර මෙසේයි.

(අ) (i) මතුගම අධ්‍යාපන කලාපයට අයත් බප/මතු/ වලගෙදර මහා විද්‍යාලය 2012 වසරේ, මධ්‍යම රජය මඟින් ක්‍රියාත්මක කරන ද්විතීයික පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කර ඇත.

එම ව්‍යාපෘතිය යටතේ ඇතුළත් වන පාසල්වලට ප්‍රදානය කරනු ලබන්නේ තාක්ෂණික විද්‍යාගාරයක් හා ඒ සඳහා අවශ්‍ය උපකරණ පමණි.

ඒ අනුව මෙම පාසල සඳහා තාක්ෂණික විද්‍යාගාරයක් හා උපකරණ ලබාදී ඇත.

(ii) පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල ගොඩනැඟිලි හා භෞතික සම්පත් සැපයීම අදාළ පළාත් සභාව මඟින් සිදු කළ යුතු වේ.

නමුත්, මධ්‍යම රජය මඟින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති සඳහා පළාත් පාසල් තෝරා ගත් විට එම ව්‍යාපෘතිය යටතේ ලබා දෙනු ලබන පහසුකම් එම තෝරා ගත් පාසල්වලටද ලබාදේ.

ඒ අනුව, මෙම පාසල මධ්‍යම රජය මඟින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘතියක් වන "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියේ "සී" කාණ්ඩයට ඇතුළත් කර, ඒ යටතේ ප්‍රදානය කරනු ලබන පහසුකම් ලබාදී ඇති නමුත් එම ව්‍යාපෘති යටතේ පන්ති කාමර ගොඩනැඟිලි ලබාදෙනු නොලැබේ.

(iii) 2012 වර්ෂයේදී ද්විතීයික පාසල් ව්‍යාපෘතිය යටතේ තාක්ෂණික විද්‍යාගාර හා උපකරණ ලබාදී ඇත.

තවද, ද්විතීයික පාසල් සංකල්පය ක්‍රියාත්මක කරනු ලැබූ මුල් කාලයේදීම, එනම් 2013 වසරේදී පරිගණක 69ක් ලබාදී ඇත.

රේඛීය අමාත්‍යාංශය මඟින් 2015 වර්ෂයේදී

[ගරු අකිල විරාජ් මහතා]

රුපියල් ලක්ෂ 19ක වියදමින් වැසිකිළි පද්ධතියක් ඉදි කර දී ඇත.

තවද, 2016 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය මඟින් මෙම පාසලට රුපියල් ලක්ෂ 15ක සුළු අලුත්වැඩියාවක් හා රුපියල් 250,000ක විදුලි අලුත්වැඩියාවන් සිදු කර ඇත.

එමෙන්ම "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ පාසලේ දන්ත සෞඛ්‍ය පහසුකම් ලබාදීම සඳහා රුපියල් ලක්ෂ 2ක මුදලක් ලබාදීමට අනුමත වී ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් "සනීපාරක්ෂාව පෙරට" ව්‍යාපෘතිය යටතේ මෙම පාසලට වැසිකිළි කැසිකිළි පහසුකම් ලබාදීම සඳහා රුපියල් ලක්ෂ 20ක් ප්‍රදානය කර ඇත.

එමෙන්ම රේඛීය අමාත්‍යාංශයෙන් ක්‍රීඩා උපකරණ ලෙස වොලිබෝල් 05ක්ද, වොලිබෝල් නෙට් 02ක්ද, නෙට්බෝල් 03ක්ද, යගුලි 04ක්ද, කවපෙති 04ක් සහ ටේප් 01ක්ද මෙම පාසලට ලබාදී ඇත.

තවද, ලී බඩු වශයෙන් මේස 50ක්ද, පුටු 50ක්ද, ගුරු පුටු 03ක්ද, ගුරු මේස 03ක්ද, කබඩ් 02ක් සහ මල්ටි මීඩියා (multimedia) උපකරණ 1ක් ද දැනටමත් මෙම පාසලට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දී අවසන්ය.

පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල ගොඩනැඟිලි හා මූලික භෞතික පහසුකම් අදාළ පළාත් සභාව විසින් ලබා දිය යුතු අතර, බස්නාහිර පළාත් සභාව මඟින් 2015දී රුපියල් ලක්ෂ 21ක පමණ වියදමින්, පැවැති ගොඩනැඟිල්ලක් අලුත්වැඩියා කර ඇත.

2017 වර්ෂය සඳහා රුපියල් ලක්ෂ 31ක මුදලක් ගොඩනැඟිල්ලක නවීකරණ කටයුතු සඳහා අනුමත වී ඇති අතර, මේ වන විට ඒ සඳහා ටෙන්ඩර් කැඳවා ඇත.

(iv) පළාත් පාසල් සඳහා ගුරුවරු සේවා ස්ථානගත කිරීම අදාළ පළාත් සභාව විසින් සිදු කරනු ලැබේ.

මෙම පාසලේ සංගීතය, විද්‍යාව යන විෂයයන් සහ 6 - 9 ශ්‍රේණිවලට දෙමළ විෂයය ඉගැන්වීමට ගුරු භවතුන් ප්‍රමාණවත් පරිදි ලබා දී ඇති බවත්,

ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාස විෂය භාර ගුරු මහත්මිය දරු ප්‍රසූතියක් වෙනුවෙන් මාස 3ක කාලයක් සඳහා දකුණු පළාතේ කරන්දෙනිය මධ්‍ය මහා විද්‍යාලය වෙත තාවකාලික සේවා අනුයුක්තයක් ලබා ඇති බවත්,

උපදේශන විෂය සඳහා ගුරු භවතුන් පත් කර නොමැති අතර, දැනට පාසලේ ජ්‍යෙෂ්ඨ ගුරු මහත්මියක විසින් මෙම විෂයයේ වැඩ ආවරණය කරන බවත්,

ඒ අනුව ගුරු හිඟයක් නොමැති බවත් බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් වාර්තා කර ඇත.

(ආ) (i) මෙම පාසල පළාත් පාසලක් වන බැවින් බස්නාහිර පළාත් සභාව මඟින් අනෙකුත් අවශ්‍ය ගොඩනැඟිලි පහසුකම් ලබා දිය යුතුය.

2012 වර්ෂයේ මෙම විද්‍යාලය ද්විතීයික පාසල් ව්‍යාපෘතියට තෝරා ගැනීමට පෙර 1 සිට 13 දක්වා පන්ති පැවැත්වෙන 1AB පාසලක් ලෙස පවත්වාගෙන ගොස් ඇත.

ඒ වන විට ශිෂ්‍ය සංඛ්‍යාව 1,020කි. වර්තමානයේ ද්විතීයික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කර 6 - 13 දක්වා පන්ති පැවැත්වෙන අතර ශිෂ්‍ය සංඛ්‍යාව 1,080ක් දක්වා වැඩි වී ඇත.

නව ගොඩනැඟිලි ලබා දී නැතත් පැවැති ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීමට කටයුතු කර ඇති බව බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් වාර්තා කර ඇත.

(ii) විදුහල්පති විසින් ඉල්ලා ඇති මූලික ගුරු අවශ්‍යතා සපුරා ඇති බව පළාත් අධ්‍යාපන ලේකම් වාර්තා කර ඇති බැවින් තවදුරටත් ගුරුවරුන් ලබා දීමේ අවශ්‍යතාවක් නොමැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා ඔය සඳහන් කරපු දේවල් ටික එම පාසලට දීපු එක හොඳයි. නමුත්, මේ පාසල මතුගම සහ අලුත්ගම කියන ප්‍රධාන නගර දෙක මැද්දේ ප්‍රධාන මාර්ගය ආසන්නයේ තිබෙන පාසලක්. 2012 වසරේදී මේක ද්විතීයික පාසලක් කරන කොට ඒ පාසලට දීපු ප්‍රධාන පොරොන්දුවක් තමයි නව ගොඩනැඟිල්ලක් ලබා දෙනවා කියන එක. මොකද, ඒ පාසලේ පන්ති කාමර සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. සුළු අලුත්වැඩියා කටයුතුවලට තමයි ඔබතුමා මුදල් වෙන් කරලා තිබෙන්නේ. එම පාසලේ පන්ති කාමර පවත්වාගෙන යන්නේ ප්‍රධාන ශ්‍රවණාගාරයේයි, ගෘහ විද්‍යා කාමරයේයි, ගුරු කාමරයේයි. ඒ නිසා මේ පාසලට තෙමහල් ගොඩනැඟිල්ලක් දිගින් දිගටම ඉල්ලා සිටිනවා. 2012දීත් පොරොන්දු වෙලා තමයි ද්විතීයික පාසලක් බවට පත් කරගත්තේ. ගරු ඇමතිතුමනි, "ළඟම පාසල - හොඳම පාසල" කියලා නම් කළාට මතුගම කලාපයට මුදල් ඇවිල්ලා නැහැ. යෝජනාව තිබුණාට තවමත් ක්‍රියාත්මක තලයේ නොවෙයි තිබෙන්නේ. තවමත් නිශ්චිත පොරොන්දුවක් ලබා දීලා නැහැ, මේ පන්ති කාමර පවත්වාගෙන යාම සඳහා තෙමහල් ගොඩනැඟිල්ලක් ලබා දෙනවා කියලා. ඒකයි මෙතැන තිබෙන මූලික ප්‍රශ්නය.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නයට මම පළමු ප්‍රශ්නය යටතේ පිළිතුරු දීලා තිබෙනවා. එම පිළිතුරේ කොටසක සඳහන් වෙනවා, "එම ව්‍යාපෘතිය යටතේ ඇතුළත් වන පාසල්වලට ප්‍රදානය කරනු ලබන්නේ තාක්ෂණික විද්‍යාගාරයක් හා ඒ සඳහා අවශ්‍ය උපකරණ පමණි" කියලා. ඒ කියන්නේ, ද්විතීයික පාසලක් බවට පත් වුණාම ඒ පාසලට දෙන්නේ තාක්ෂණික විද්‍යාගාරයක් පමණයි. ඒක පසු ගිය ආණ්ඩුවේ සංකල්පයක් මත තමයි දීලා තිබෙන්නේ. "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ අපි ප්‍රමුඛතාව හඳුනාගෙන තමයි මේ පාසල් තෝරා ගනු ලැබුවේ. උදාහරණයක් හැටියට 2015 ජනවාරි මස 09වැනිදා අපේ නව රජය පත් වුණාට පස්සේ සියයට හැට ගණනකටයි මේ රටේ විදුලිය තිබුණේ. නමුත්, දැන් සියයට 95කට විදුලිය තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ අවුරුදු දෙක තුළ අලුතින් වැසිකිළි 26,000ක් හදලා තිබෙනවා.

අපි දැන් හදන්නේ ප්‍රමිතියකට අනුව යන්නයි; ජාත්‍යන්තර ප්‍රමිතිය අනුව ළමුන් 50කට එක වැසිකිළියක් බැගින් හදන ව්‍යාපෘතියකට යන්නයි. ඒ සඳහා පාසල් 10,361 අතරින් පාසල් 7,000ක් අපි තෝරාගෙන තිබෙනවා. හැබැයි, ඒ පාසල් 7,000

තෝරා ගත්තාට වැඩියෙන්ම ප්‍රමුඛතාව දිය යුතු පාසල්වලට තමයි ඉස්සෙල්ලාම අවධානය යොමු කරන්නේ. ඒ අනුව තමයි මුදල් ප්‍රතිපාදන යොදවන්නේ. ඔබතුමා දන්නවා, කළුතර දිස්ත්‍රික්කයේ "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘති කොච්චර ක්‍රියාත්මක වෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පාසල් සඳහා ක්‍රීඩා උපදේශකවරු බඳවා ගැනීමට ඔබතුමා දැන් කටයුතු කරගෙන යනවා. එහි වයස් සීමාව වයස අවුරුදු 35ක් බව සඳහන් වනවා. මෑතක් වන තුරු ක්‍රීඩා උපදේශකවරු බඳවා නොගත් නිසා ස්වේච්ඡාවෙන් කටයුතු කළ පිරිසක් සිටිනවා. ඒ අය ජාතික මට්ටමේ විවිධ සහතික තිබෙන සුදුසුකම්ලාභීන්ද වනවා. නමුත් වයස් සීමාව අවුරුදු 35 නිසා 200ක පමණ පිරිසකට යම් ගැටලුවක් මතු වී තිබෙන බවත් වාර්තා වෙනවා. ඒ අය දක්ෂතාව සහිත අය. සුදුසුකම් තිබෙන මෙවැනි අයගේ සේවය තවදුරටත් ලබා ගන්නට මේ තුළ ක්‍රමවේදයක් සකස් කරන්නට බැරි ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ගුරු ව්‍යවස්ථාව අනුව තමයි බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක කරන්නේ. ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීමේදීත් මේ ගැටලුව මතු වුණා. පුරප්පාඩු 1,190ක් තිබුණා. වයස අවුරුදු 30ට අඩුවෙන් තමයි ඒ සඳහා බඳවා ගත යුතුව තිබුණේ. නමුත් ගැසට් කළාම අයදුම්පත් පන්සිය ගණනක් තමයි ලැබුණේ. ඒ නිසා අපි නැවත PSC එකේ අනුමැතිය ලබා ගත්තා, වයස් සීමාව අවුරුදු 35 කරලා දෙන්න කියලා.

ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය ක්‍රීඩා පුහුණුකරුවන් බඳවා ගැනීමේදී වයස් සීමාව අවුරුදු 35 කරලා තිබෙද්දීත් අයදුම්පත් 17,000ක් ලැබිලා තිබෙනවා. ඒ නිසා බඳවා ගැනීමේ පටිපාටියෙන් පිට බඳවා ගන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, ඔබතුමා කියන කාරණය කළොත් ඉදිරියේදී එක් එක් අංශවලට ගුරුවරු බඳවා ගැනීමේදීත් ගැටලු මතු වනවා. උදාහරණයක් වශයෙන් ශිෂ්‍ය උපදේශන සේවයට ගුරුවරු බඳවා ගන්න බලාපොරොත්තු වනවා.

ඒ හැම එකකටම මෙය බල පැවැත්වෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබෙන්නත් ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියූ කාරණය සම්බන්ධයෙන් මාවත් හමු වන්න කණ්ඩායම් ගණනාවක් ආවා. සමහර අයට සුදුසුකම් පවා නැහැ. හැබැයි, කාලයක් තිස්සේ වැඩ කරලා තිබෙනවා. එහෙම බලන කොට ඒ ආපු කණ්ඩායමේ සුදුසුකම් තිබෙන අය බොහොම පොඩි ප්‍රමාණයකුයි සිටියේ. අපි ඉදිරියේදී, ඒ අය වැඩ කරපු කාලය යනාදී හැම දෙයක්ම බලලා, යම් පදනමක් උඩ, පුහුණුකරුවන් වශයෙන්වත් ඒ අය ගන්න පුළුවන්ද කියලා බලන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 7 - 1192/'16-(1), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පොලීසිය "සයිටම්" ආයතනයට මෘත ශරීර භාර දීම : නෛතික බලය
## 'சயிட்டம்' நிறுவகத்துக்கு பொலிசாரினால் பிரேதங்கள் வழங்கப்பட்டமை: சட்ட அதிகாரம்
## HANDING OVER CADAVERS TO "SAITM" BY POLICE: LEGAL AUTHORITY

1320/'16

**9. ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සයිටම් නමැති (SAITM) පෞද්ගලික වෛද්‍ය ආයතනයට යම් මෘත ශරීර සහ මෘත ශරීර කොටස් පොලීසිය විසින් භාර දී ඇතැයි යන්න මේ වන විට හෙළිදරව් වී ඇති බව දන්නේද;

(ii) එසේ ක්‍රියා කිරීමට පොලීසියට නෛතික බලයක් තිබේද;

(iii) එසේ නෛතික බලයක් පොලීසියට නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும் ஒழுங்கும் மற்றும் தென் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'சயிட்டம்' (SAITM) எனப்படும் தனியார் மருத்துவ நிறுவகத்திற்கு பொலிசாரினால் ஏதேனும் பிரேதங்கள் மற்றும் பிரேதத்தின் பகுதிகள் வழங்கப்பட்டுள்ளன என்பது இன்றளவில் தெரியவந்துள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) அவ்வாறு செயற்படுவதற்கு பொலிசாருக்கு சட்ட அதிகாரம் உள்ளதா என்பதையும்;

(iii) பொலிசாருக்கு அவ்வாறு சட்ட அதிகாரம் இல்லையெனின், அது தொடர்பில் எடுக்கும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

asked the Minister of Law and Order and Southern Development:

(a) Will he inform this House -

(i) whether he is aware that certain cadavers and human remains have been handed over to the private medical institute called, "SAITM" by the police;

(ii) whether the police have legal authority to do so; and

(iii) if the police do not have such legal authority, of the nature of action that will be taken in this regard?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා පොලීසිය විසින් SAITM පෞද්ගලික වෛද්‍ය ආයතනය වෙත මෘත ශරීර කොටස් භාර දී නොමැත.

(ii) අධිකරණ නියෝගයකින් තොරව මෘත ශරීරයක් හෝ මෘත ශරීර කොටසක් කිසිදු ආයතනයකට භාර දීමට ශ්‍රී ලංකා පොලීසියට නෛතික බලයක් නොමැත.

(iii) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෘත ශරීර කොටස් SAITM ආයතනයට ලබා දෙන්නට යෙදුණාය කියා තොරතුරක් රාජ්‍ය කටයුතුවලදී හෙළිදරව් වුණාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ ප්‍රශ්නය අදාළ අමාත්‍යතුමාට යොමු කරන්නම්. මා දන්නේ, මේ ඉදිරිපත් කර තිබෙන පිළිතුර ගැන විතරයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මා කියන්න උත්සාහ කරන්නේ, හිටපු අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් සිදු කරනු ලැබූ මෘත ශරීර පරීක්ෂණයකින් පස්සේ ඒ මෘත ශරීර කොටස් කිහිපයක් SAITM ආයතනයට යවනු ලැබුවාය කියා, පරීක්ෂණයකදී හෙළිදරව් වුණු බවයි. මෙය රජයේ කටයුතුවලදී හෙළිදරව් වූ සිද්ධියක්. ඒ තත්ත්වය ගැන සොයා බලා අපට කියන්න, මෙහෙම දෙයක් සිදු වුණාද, නැද්ද, මෘත ශරීර කොටස් SAITM එකට යැව්වාද, යැව්වේ කවුද කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එහෙම හෙළිදරව් වීමක් සිද්ධ වෙලා නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. කිසියම් ආකාරයකට එවැනි මෘත ශරීර කොටස් SAITM ආයතනයට යවනු ලැබූ බව, නිලතලවල කටයුතු ඉටු කිරීමේදී යම් අයකු විසින් ප්‍රකාශ කර තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් ඔබතුමා කුමක් කරනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ පිළිබඳව පියවර ගන්න පුළුවන්.

## කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වෙන් කළ මුදල් : උපයෝජනය

### கமத்தொழில் அபிவிருத்திக்காக ஒதுக்கிய நிதி : பயன்பாடு

### MONEY ALLOCATED FOR DEVELOPMENT OF AGRICULTURE: UTILIZATION

1375/'16

**10. ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 129ට අනුව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මනා සහයෝගීතාවය දිරිගැන්වීම සඳහා රුපියල් මිලියන 1000ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබූ එකී රුපියල් මිලියන 1000 උපයෝජනය කළ ආකාරය කවරේද;

(iii) අය වැය යෝජනා මඟින් වෙන් කළ එකී රුපියල් මිලියන 1000ක මූල්‍ය සම්පත්වල ප්‍රතිලාභීන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 வரவு செலவு திட்டத்தில் 129ஆம் இலக்க முன்மொழிவின் பிரகாரம் அரச மற்றும் தனியார் துறையின் சிறந்த ஒத்துழைப்பை ஊக்குவிப்பதற்காக 1000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) கமத்தொழில் அபிவிருத்திக்காக ஒதுக்கப்பட்ட மேற்படி 1000 மில்லியன் ரூபாய் பயன்படுத்தப்பட்ட விதம் யாதென்பதையும்;

(iii) வரவு செலவு திட்ட முன்மொழிவின் ஊடாக ஒதுக்கப்பட்ட மேற்படி 1000 மில்லியன் ரூபாய் நிதி வளங்களுக்குரிய பயனாளிகளின் பட்டியலொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) whether he accepts that according to Budget Proposal No. 129 for 2016, Rs. 1,000 million had been allocated for encouraging healthy co-operation between the private and public sectors;

(ii) the manner in which this Rs. 1,000 million, which had been allocated for development of agriculture, was utilized; and

(iii) whether he will submit a list of beneficiaries of the financial resources flowing from this Rs. 1,000 million allocated from the Budget Proposals?

(b) If not, why?

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

2016 අය වැය යෝජනා අංක 129ට අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මනා සහයෝගිතාව තුළින් උසස් තත්ත්වයේ බීජ නිෂ්පාදනය කිරීමේ වැඩසටහන -Production of High Quality Seeds through PPP Modes- සඳහා රුපියල් මිලියන 1000ක් වෙන් කර තිබුණි.

(ii)

| ආයතනය | ලබා දුන් මුදල (රු.මිලියන) | 2016.12.31 දිනට වියදම (රු.මිලියන) | පැහැදිලි කිරීම් |
|---|---|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 428.16 | 121.031 | (i) |
| ඌව පළාත් සභාව | 3.30 | 3.313 | (ii) |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 91.21 | 0.070 | (iii) |
| | 522.67 | 124.414 | |

ඉහත වියදම්වලට අමතරව උක්ත වැඩසටහන යටතේ නිරවුල් කිරීම සඳහා රුපියල් මිලියන 81.895ක් හා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 91ක බැඳීම් පවතී.

(i) සහතික බීජ නිෂ්පාදනය කරන කොන්ත්‍රාත් ගොවීන් පුද්ගලික ආයතන වෙත ලබා දිය යුතු ගුණාත්මක මූලික බීජ සංවර්ධනය සඳහා අවශ්‍ය වන ගොවිපල යාන්ත්‍රීකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය හා පර්යේෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 428.16ක මුදල කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත වෙන් කරන ලදී. මින් රුපියල් මිලියන 121ක් 2016 වර්ෂයේදී වැය වී ඇති අතර, ඉහත සඳහන් පරිදි බැඳීම් ලෙස රුපියල් මිලියන 81.89ක් තවදුරටත් 2017 වර්ෂයේදී ගෙවීමට ඉතිරි වී ඇත.

(ii) ඌව පළාත් සභාව වෙත වෙන් කරන රුපියල් මිලියන 3.313ක මුදල උපයෝජනය කළ ආකාරය පහත දැක්වේ.

ඔක්කම්පිටිය ගොවිපළ අතිරේක ආහාර භෝග මූලික බීජ නිෂ්පාදන ගොවිපළක් වන අතර, එම බීජ කොන්ත්‍රාත් ගොවීන් හරහා ගුණනය කර සහතික කරන ලද බීජ ගොවීන්ට ලබා දීම සිදු කරයි. මෙම ගොවිපළ තුළ අතිරේක ආහාර භෝග බීජ නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් යල කන්නයේ සිදු කරනු ලැබේ. යල කන්නයේදී ගොවිපළ සඳහා කුඹුක්කන් ඔයෙන් ජල සම්පාදනය කරන අතර, යල කන්නයේ ගොවිපළ තුළට නිකුත් කෙරෙන ජල සැපයුම ප්‍රමාණවත් නොවන බැවින්, ඊට විසඳුමක් ලෙස ගොවිපළට ජලය ලබා ගන්නා වැව පිළිසකර කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව වැය විෂය 118-2-3-38-2509 යටතේ රුපියල් මිලියන 3.313ක් වියදම් කර වැව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලදී. මේ අනුව ඉදිරි වර්ෂයේදී කොන්ත්‍රාත් ගොවීන් සමඟ සහතික බීජ නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ඇත.

(iii) කෘෂිකර්ම අමාත්‍යාංශයට වෙන් කළ රුපියල් මිලියන 84.936ක මුදල උපයෝජනය කළ ආකාරය පහත දැක්වේ.

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පුවත් පත් දැන්වීමක් මඟින් පුද්ගලික අංශයේ මීට අදාළ ව්‍යාපෘති යෝජනා ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘති යෝජනා අතරින් තෝරා ගන්නා ලද ව්‍යාපෘති යෝජනා 3ක් සඳහා ඔවුන්ගෙන් ව්‍යාපෘතිවල යන්ත්‍ර සූත්‍ර/ උපකරණ මිලදී ගැනීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වැය වන මුදලින් සියයට 50ක ගැළපුම් ආධාරයක් - matching grant- ලබා දීමට කටයුතු කරනු ලැබිණි. ඒ අනුව මෙම ව්‍යාපෘති 3 සඳහා රුපියල් මිලියන 91.217ක මුදලක් ගෙවීමට සූදානම්ව ඇත.

අදාළ පෞද්ගලික ආයතනය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය අතර අත්සන් කිරීමට නියමිත ගිවිසුම නීති උපදෙස් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, නීති උපදෙස් ලැබුණු වහාම එම ගෙවීම්ද සිදු කිරීමට හැකි වනු ඇත.

ඒ අනුව පහත නම් සඳහන් ආයතන මඟින් අදාළ මිල ගණන් යටතේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇත.

ආයතනය මුදල (රු.මිලියන)

Aroma Exim (Pvt) Limited - 67.50

Winpack Global Solution (Pvt) Limited - 11.00

CIC Seeds (Pvt) Limited - 12.717

Total 91.217

(අ) (iii) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ප්‍රතිලාභීන් ලෙස පහත ආයතන දැක්විය හැකිය.

1. Aroma Exim (Pvt) Limited
2. Winpack Global Solution (Pvt) Limited

[ගරු වසන්ත අලුවිහාරේ මහතා]

3. CIC Seeds (Pvt) Limited
4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බීජ ගොවිපළ සංවිධානවල)

ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

5. ඌව පළාත් සභාව (පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඔක්කම්පිටිය ගොවිපළ)

(ආ) අදාළ නොවේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. රුපියල් මිලියන දහසක් කියන්නේ රුපියල් බිලියන එකක්. ඒ කියන්නේ විශාල මුදල් ප්‍රමාණයක්. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කාලය ලබා ගෙන දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කිරීම පිළිබඳව මා බොහොම ස්තුතිවන්ත වෙනවා. කරුණාකරලා, වියදම් කරපු ගණන සියයට ගණනක් වශයෙන් මට කියනවාද?

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )

ගරු මන්ත්‍රීතුමනි, ඉල්ලා තිබුණු මුදල්වලින් සියයට 50ක් තමයි අපේ ව්‍යාපෘතිවලට ලැබී තිබෙන්නේ. ඒ සියයට 50න් තමයි අපි ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. සියලුම අමාත්‍යාංශවලට- මේ පාර්ලිමේන්තුවේ අය වැය ලේඛනයෙන් වෙන් කරන මුදලින් සියයට 50ක් තමයි එතුමාට ලැබී තිබෙන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශයට රුපියල් බිලියන 203ක් වෙන් කරලා තිබෙනවා. 2016 වර්ෂයේදී වියදම් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 65යි. එතකොට වියදම් කළ ප්‍රමාණය වාගේ දෙගුණයක් -රුපියල් බිලියන 138ක්- වියදම් නොකළ එක අධ්‍යාපන ඇමතිතුමාගේ දුර්වලකමක් කියලායි හිතෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඒ නිසා මේ ව්‍යාජ ඉලක්කම්, අය වැය ලේඛනයට දෙන්න බැරි මුදල් මෙම ලේඛනයට ඇතුළත් කිරීම පිළිබඳව ඔබතුමා පාර්ලිමේන්තුව වශයෙන් කටයුතු කරන්න කියා ඉල්ලා සිටින අතර, ඉතිරි සියයට 50 වියදම් කළ ආකාරය පිළිබඳව ඔබතුමාගේ කරුණු ටික බලලා මම වෙනම ප්‍රශ්නයක් අහන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් : මාතලේ දිස්ත්‍රික්කය
## காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்கு உரித்தான காணிகள்: மாத்தளை மாவட்டம்
## LANDS BELONGING TO LAND REFORM COMMISSION: MATALE DISTRICT

1518/'17

**12.ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධාන ප්‍රකාරව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි වගාව සහිත ඉඩම්වලින්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ගැසට් නිවේදන මඟින් පාලනය හා කළමනාකරණය සඳහා ලබා දී ඇති ඉඩම්වලින් කොපමණ ප්‍රමාණයක් පාලනයකින් තොරව මුඩු බිම් සහ කුඹුරු ඉඩම් වශයෙන් පවතීද;

(ii) එම ඉඩම් මැන හඳුනාගෙන තිබේද;

(iii) එම ඉඩම් ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා මේ වනවිට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එම ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශ කළ තැනැත්තන්ගේ නීතිමය බැඳීම් සඳහා ලබාදීමට සහ කෘෂිකාර්මික නොවන කටයුතු වෙනුවෙන් යොදා ගැනීමට හැකියාවක් පවතීද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1972ஆம் ஆண்டின் 1ஆம் இலக்க காணி மறுசீரமைப்பு சட்டத்தின் ஏற்பாடுகளுக்கு அமைய, காணி மறுசீரமைப்பு ஆணைக்குழுவிற்கு உரித்தான மாத்தளை மாவட்டத்தில் அமைந்துள்ள பயிர்செய்கைகளைக் கொண்ட காணிகளில், இலங்கை அரசாங்க பெருந்தோட்டக் கூட்டுத்தாபனத்திற்கும் மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்கும் வர்த்தமானி அறிவித்தல் மூலம் நிருவாகம் மற்றும் முகாமைத்துவத்துக்காக வழங்கப்பட்டுள்ள காணிகளில் எவ்வளவு காணிகள் கட்டுப்பாடின்றி தரிசு நிலமாகவும் வயற்காணிகளாகவும் காணப்படுகின்றன என்பதையும்;

(ii) மேற்படி காணிகள் அளவை செய்யப்பட்டு இனங்காணப்பட்டுள்ளனவா என்பதையும்;

(iii ) மேற்படி காணிகளை பயனுறுதியான விதத்தில் பயன்படுத்திக்கொள்ளும் பொருட்டு தற்போது ஒரு வேலைத்திட்டம் தயார் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

( iv ) மேற்படி காணிகளை, காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்கு காணிகளை வெளிப்படுத்திய ஆட்களின் சட்டரீதியான கடப்பாடுகளைப் பெற்றுக்கொடுப்பதற்கு மற்றும் விவசாயம் அல்லாத நடவடிக்கைகளுக்குப் பயன்படுத்திக்கொள்வதற்கான இயலுமை காணப்படுகின்றதா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Parliamentary Reforms:

(a) Will he state -

(i) the extent of lands that exist as barren and agricultural lands out of the lands with forest cultivation in Matale District that comes under the purview of Land Reform Commission and the lands of which the control and management have been vested in the Sri Lanka State Plantation Corporation and Janatha Estate Development Board by gazette Notifications, in terms of the provisions of Land Reform Act, No. 1 of 1972;

(ii) whether such lands have been surveyed and identified;

(iii) whether there is a programme in place to utilize aforesaid lands in an effective manner; and

(iv) whether there is any possibility of utilizing aforesaid lands to grant the legal obligations of the individuals who declared the lands with the Land Reforms Commission and for non agricultural affairs?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඉඩම් මැන හඳුනා ගැනීමක් කර නොමැති බැවින්, මුඩු බිම් හා කුඹුරු ඉඩම් ප්‍රමාණය නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක.

(ii) නොමැත.

(iii) මෙම ඉඩම්වල කළමනාකරණය වතු සමාගම් විසින් සිදු කරන බැවින්, ඒවා ඵලදායීව යොදා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සකස් කර නොමැත.

(iv) පවතී.

නිල වශයෙන් අවලංගු කිරීම කර ගැනීමෙන් පසුව නැවත ලබා දීමේ හැකියාව පවතී.

මාතලේ දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වූ වගාව සහිත ඉඩම් හෙක්ටෙයාර 7,687.29ක (හත්දහස් හයසියඅසූහතයි දශම දෙකයි නවයක) පමණ ප්‍රමාණයක් පාලනය හා කළමනාකරණය සඳහා ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් රාජ්‍ය වැවිලි සංස්ථාවට හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ලබා දී ඇත. එම ආයතන විසින් මෙම ඉඩම් වතු සමාගම් වෙත සෘජු බදු හැටියට ලබා දී ඇත.

වර්තමානයේ මෙම ඉඩම් භුක්ති විඳිනු ලබන වතු සමාගම් විසින් අදාළ ඉඩම් මැන නිශ්චිතව හඳුනා ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ඉඩ නොදෙන බැවින්, එකී ඉඩම් ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම දැනට අපහසු වෙලා තිබෙනවා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, ළඟදීම අදාළ පාර්ශ්වයන් එක්ක සාකච්ඡා කරලා එම කටයුත්ත කරන්න පුළුවන් තත්ත්වයක් හදා ගන්න.

ඊයේ වැවිලි කර්මාන්ත ඇමතිතුමාත්, වතු යටිතල පහසුකම් ඇමතිතුමාත්, මමත් එකතු වෙලා සාකච්ඡා කළා. එහිදී වතුවල පර්චස් හත වාගේ දෙන ඉඩම්වලටත් කඩිනමින් ඔප්පු දෙන්න අපි තුන්දෙනාම එකඟතාවකට ආවා.

(ආ) අදාළ නැත.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම්වලින් විශාල ප්‍රමාණයක් මේ වෙනකොට රාජ්‍ය වැවිලි සංස්ථාවටත්, ජනවසමටත් දීලා තිබෙනවා. ඒ ගොල්ලන් ආපසු බදු දීලාත් තිබෙනවා. ඒ බදු ගත්ත අය ආපසු අතුරු බදු දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ අයට දීපු ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් මේ වෙන කොට ඒ අය භුක්ති විඳිනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අසනවා, ඒවා අත්පත් කර ගන්න කුමක් හෝ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමියනි, එහෙම තැන් ගැන වාර්තා වෙලා තිබෙනවා. නොයෙක් ගැටලු සහගත තැන් තිබෙනවා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් පරිහරණය පිළිබඳව. අපි ක්‍රමානුකූලව ඒවාට යම් පියවරක් අරගෙන, ඒවා ඵලදායී විධියට යොදන්න පුළුවන් ක්‍රමයක් හදනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අපේ ගම්වල ජනතාව සුළු ප්‍රමාණයෙන් ඒ ඉඩම් භුක්ති විඳිනවා. ඒවාට ඒ ගොල්ලන් LRC එක නියම කරන මුදල් ප්‍රමාණ පවා ගෙවා තිබෙනවා. නමුත් මේ වෙන කොට එම පුද්ගලයන්ට ඒ සඳහා නිසි බලපත්‍රයක් නිකුත් වෙලා නැහැ. ඒක කඩිනම් කරන්න කටයුතු කරනවාද කියන එක මම ඔබතුමාගෙන් අසනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මගේ දිස්ත්‍රික්කයෙන් මම පොඩි අත්හදා බැලීමක් කරන්න ඒකට වැඩ පිළිවෙළක් ආරම්භ කළා. අපි බලාපොරොත්තු

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

වෙනවා, එම වැඩ පිළිවෙළ රට පුරාම ක්‍රියාත්මක කරන්න. ඔබතුමියගේ ප්‍රදේශයේත් අපි එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නම්. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමාගේ මැතිවරණ ප්‍රකාශයේ තිබෙනවා, මේ රටේ ලක්ෂ සංඛ්‍යාත පිරිසකට සින්නක්කර ඔප්පුව ලබා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා කියලා. එතුමා විසින් අපට දුන් උපදෙස් අනුව අපි එම කටයුතුත් කඩිනමින් ආරම්භ කරලා, ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ -සිහිනයක් හැටියට තිබුණු- බලාපොරොත්තුව 2020 වර්ෂය වෙන කොට යථාර්ථයක් කරනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

## ඩබ්ලිව්.ජී. සිරිල් පෙරේරා මහතා පදිංචි ඉඩම: නීත්‍යානුකූල හිමිකම

திரு. டபிள்யு.ஜீ. சிறில் பெரேரா வசிக்கும் காணி : சட்டபூர்வ உரிமை

LAND OCCUPIED BY MR. W.G. CYRIL PERERA: LEGAL ENTITLEMENT

1546/'17

**13.ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**

(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)

(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) (i) අම්පාර, කල්මුණේ පාර, ඉන්ධන පිරවුම්හල ඉදිරිපිට පදිංචි ඩබ්ලිව්.ජී. සිරිල් පෙරේරා මහතා එම ලිපිනයෙහි වසර 17ක් අඛණ්ඩව පදිංචිවී සිටින බවත්;

(ii) එම ඉඩම් කොටස සඳහා නීත්‍යානුකූල හිමිකම ලබා ගැනීමට දිගුකාලීනව කරන ලද ඉල්ලීමට අනුව අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් චක්‍රලේඛ අංක 2008/4 අනුව පවත්වන ලද ඉඩම් කච්චේරියකින් පර්චස් 20ක ඉඩම් කොටසක් ඔහුට ලබාදීමට නිර්දේශ වූ බවත්;

(iii) එහෙත්, එම ඉඩම් කොටස විවිධ හේතු දක්වමින් ලබා නොදීම සම්බන්ධයෙන් ඔහු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු, එම කොමිසම විසින් සිදු කරන ලද විමර්ශනය අවසානයේදී ඒ මහතා පදිංචි ඉඩම නීත්‍යානුකූලව ඔහුට ලබාදීමට නිර්දේශ කරනු ලැබූ බවත්;

(iv) නමුත්, මේ දක්වා ඔහුට එම ඉඩමේ අයිතිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) පෙරේරා මහතාට සිදුවී ඇති මෙම අගතියට සහ අසාධාරණයට සහනයක් සලසා දීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை, கல்முனை வீதி, எரிபொருள் நிரப்பு நிலையத்திற்கு முன்னால் வசிக்கும் திரு. டபிள்யு.ஜீ. சிறில் பெரேரா மேற்படி முகவரியில் 17 ஆண்டுகள் தொடர்ந்து வசித்து வருகின்றார் என்பதையும்;

(ii) மேற்படி காணிக்கு சட்டரீதியான உரிமையைப் பெற்றுக்கொள்வதற்காக நீண்டகாலமாக விடுக்கப்பட்டுவந்த கோரிக்கைக்கு அமைவாக அம்பாறை பிரதேச செயலகத்தினால் சுற்றறிக்கை இலக்கம் 2008/4 இற்கு அமைவாக நடத்தப்பட்ட காணிக் கச்சேரியொன்றில் 20 பர்ச்சஸ் காணிப் பகுதியொன்றை இவருக்குப் பெற்றுக்கொடுக்க விதந்துரைக்கப்பட்டதென்பதையும்;

(iii) எனினும், மேற்படி காணிப் பகுதியை பல்வேறு காரணங்களை முன்வைத்து பெற்றுக்கொடுக்காமை பற்றி இவர் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவிற்கு விளக்கமளித்த பின்னர், இவ்வாணைக்குழுவினால் மேற்கொள்ளப்பட்ட புலனாய்வின் இறுதியில் இவர் வசிக்கும் காணியைச் சட்டரீதியாக இவருக்குப் பெற்றுக்கொடுக்க விதந்துரைக்கப்பட்டதென்பதையும்;

(iv) எனினும், இற்றைவரையில் இவருக்கு மேற்படி காணியின் உரிமை பெற்றுக்கொடுக்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) திரு. பெரேராவிற்கு ஏற்பட்ட மேற்படி பாதிப்பு மற்றும் அநீதிக்கு நியாயமான நிவாரணத்தைப் பெற்றுக்கொடுப்பதற்கு மேற்கொள்ளப்படும் வழிமுறைகள் யாவை என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Parliamentary Reforms:

(a) Is he aware that-

(i) Mr. W.G. Cyril Perera residing opposite the filling station at Kalmunai Road, Ampara has been a resident of that address continuously for 17 years;

(ii) It has been recommended to allocate him 20 perch plot of land by a land kachcheri held as per Circular No.2008/4 by the Ampara Divisional Secretariat consequent to a long term request made by him seeking legal entitlement for the said plot of land;

(iii) subsequent to him making submissions to the Human Rights Commission of Sri Lanka regarding the non-allocation of the said land citing various reasons, it has been recommended at the conclusion of the inquiry conducted by the said Commission that the land on which he has been residing should be handed over to him legally; and

(iv) the entitlement of the said land has still not been granted to him?

(b) Will he inform this House as to what measures will be initiated to offer relief to the prejudice and injustice caused to Mr. Perera?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමා ඊයේ අහපු ප්‍රශ්නය නේද මේ?

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ඔව්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) සිරිල් පෙරේරා මහතා එම ඉඩම අනවසරයෙන් භුක්ති විඳ ඇත.

(ii) ඔව්.

(iii) ඔව්.

(iv) ඔව්.

(ආ) මෙම ගැටලුව සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2016 දෙසැම්බර් 16 දිනැතිව ලබාදුන් නිර්දේශ ප්‍රකාරව එය කඩිනමින් විසඳන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2017 මාර්තු 8 දිනැති ලිපිය මඟින් අම්පාර ප්‍රාදේශීය ලේකම්වරයා වෙත උපදෙස් ලබාදී තිබෙනවා. එම ලිපියත් මා ළඟ තිබෙනවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, එතුමාට ඒ ඉඩම ලබා දෙන්නේ කවදාද? ඔහු අවුරුදු 17ක් තිස්සේ එම ඉඩමේ පදිංචිව ඉන්නවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අවුරුදු 17ක් අනවසරයෙන් පදිංචිව ඉඳලා තිබෙනවා. ඒ ස්ථානය ගැනයි, පුද්ගලයා ගැනයි ඔබතුමා දන්නවානේ. අම්පාරේ මෙම සිද්ධිය පිළිබඳව මම සොයා බැලුවා. ඇත්ත වශයෙන්ම යාබදව ඇති පර්චස් 20 භූමිය ඔහුට ලබා දෙන්න දෙපාර්ශ්වය එකඟ වෙලා තිබෙනවා.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ඔහු අවුරුදු 17ක් තිස්සේ එම ස්ථානයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනවා, ගරු ඇමතිතුමනි. එම ව්‍යාපාරය අවුරුදු 17ක් තිස්සේ නගර සභාවේ ලියා පදිංචි ව්‍යාපාරයක්. ඔහු ලයිට් බිල්, වතුර බිල් ගෙවලා තිබෙනවා. ඉඩම් කොමසාරිස්වරයා නිර්දේශ කරලා තිබෙනවා, ප්‍රාදේශීය ලේකම් සහ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් නිර්දේශ කරලා තිබෙනවා. දහහත් අවුරුද්දක් පදිංචිව ඉන්නවා. දැන් ඔබතුමාම කිව්වානේ, ලක්ෂ ගණනකට සින්නක්කර ඔප්පු දෙනවා කියලා. දහහත් අවුරුද්දක් පදිංචි මේ මනුස්සයා පර්චස් 20 සඳහා බලපත්‍රයක් ඉල්ලන්නේ, සින්නක්කර ඔප්පුවක් නොවෙයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔහුට එම බලපත්‍රය කඩිනමින් ලබා දෙන්න කියලා අම්පාර දිසාපති කාර්යාලයට දන්වලා තිබෙනවා. මා දන්නා තරමින් පරණ අයිතිකාරයෙකුත් ඇවිත් උද්ඝෝෂණයක් කර තිබෙනවා. එවැනි කුමක් හෝ ප්‍රමාදයකුත් වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ ගැන දන්නවා ඇති, මටත් වඩා හොඳින්.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
අලුත් අයිතිකාරයෙක්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කෙසේ හෝ එවැනි දෙයක් වුණා නේද? ඒක තමයි ප්‍රමාද වන්න හේතුව.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ඔව්, අලුත් අයිතිකාරයෙක් ඇවිල්ලා. නමුත් ඉඩම් කොමසාරිස්තුමා කියන්නේ, පෙරේරා මහතාට එය දෙන්න කියායි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔව්, ඉඩම් අමාත්‍යාංශය දන්වා තිබෙන්නේ, එය ඉක්මනින් දෙන්න කියායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා ඒ ගැන සොයා බලන්න.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
බොහොම ස්තුතියි. අලුත් ඉඩම් අමාත්‍යතුමා මේ ප්‍රශ්නය විසඳනවා නම් හොඳයි.

## නාය යෑමේ අවදානමට ලක් වූ වතු : කෑගල්ල දිස්ත්‍රික්කය
## மண்சரிவு அபாயத்துக்குள்ளான தோட்டங்கள் :கேகாலை மாவட்டம்
LANDSLIDE PRONE ESTATES: KEGALLE DISTRICT

1582/'17

**15.ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 මැයි මාසයේ දිවයිනට බලපෑ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් නාය ගිය හා නාය යෑම් අවදානමට ලක් වූ කෑගල්ල දිස්ත්‍රික්කයේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල නම් කවරේද;

(iii) අධික වර්ෂාව හේතුවෙන් නාය යෑමෙන් හා නාය යෑමේ තර්ජනයට ලක් වීමෙන් අවතැන් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

[ගරු කනක හේරත් මහතා]

(iv) අවතැන් වූ පවුල් සඳහා පදිංචියට රජයෙන් ස්ථිරව නිවාස ලබා දී තිබේද;

(v) එසේ නොමැති නම්, ඔවුන් මේ වන විට පදිංචිව සිටින ස්ථාන කවරේද;

(vi) මෙම අවතැන් පවුල් සඳහා රජයෙන් නිවාස ලබා දීම අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 மே மாதத்தில் நாட்டில் தாக்கத்தை ஏற்படுத்திய சீரற்ற காலநிலையின் காரணமாக மண்சரிவுக்குள்ளாகிய மற்றும் மண்சரிவு அபாயத்தை எதிர்நோக்கிய கேகாலை மாவட்டத்திலுள்ள தோட்டங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி தோட்டங்களின் பெயர்கள் யாவையென்பதையும்;

(iii) அதிக மழை காரணமாக ஏற்பட்ட மண்சரிவினாலும் மண்சரிவு அபாயத்தை எதிர்நோக்கியமையினாலும் இடம்பெயர்ந்த குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) இடம்பெயர்ந்த குடும்பங்கள் குடியிருப்பதற்காக அரசினால் நிரந்தர வீடுகள் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) இன்றேல், இவர்கள் இப்போது குடியிருக்கின்ற இடங்கள் யாவை என்பதையும்;

(vi) மேற்படி இடம்பெயர்ந்த குடும்பங்களுக்கு அரசினால் வீடுகள் வழங்கி முடிக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management:

(a) Will he inform this House-

(i) the number of estates in Kegalle District where landslides were reported and that were landslide prone due to the adverse weather conditions experienced by the country in May 2016;

(ii) the names of estates;

(iii) the number of families who were displaced from landslides and landslide risks occurred due to heavy showers;

(iv) whether permanent houses have been provided for the displaced families;

(v) if not, the places where they are currently residing; and

(vi) a date of which the process to handover houses to the displaced families will be completed?

(b) If not, why?

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு துனேஷ் கங்கந்த - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)

(The Hon. Dunesh Gankanda - Deputy Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වතු සංඛ්‍යාව 14කි. ඒ පිළිබඳ විස්තර ඇමුණුමෙහි සඳහන් වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(ii) එම වතුවල නම් පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ග්‍රාම නිලධාරි වසම | වත්තේ නම | අවදානමට ලක් වූ ක්ෂේත්‍ර අංකය හෝ කොටස |
|---|---|---|---|---|
| 01 | දෙහිඕවිට | 119 හල්ගොඩ | ඩෙන්ස්වර්ත් | 145612m 193592m (2014 රබර් වගාව) |
| 02 | | 115 බී බොරලන්කඩ | අයිලා | - |
| 03 | | 123 බටංගල | වුඩ්න්ඩ් | යෝගමුව |
| 04 | | මඩගම්මන | තලපිටියවත්ත | 1984 හා 1986 රබර් |
| 05 | | 123 බටංගල | ග්ලාසල් | 2008 කොටස |
| 06 | | 123 බටංගල | යෝගම | - |
| 07 | | 122 ඒ රංගේගම | රංගේගම | 2015 කොටස |
| 08 | දෙහිඕවිට හා ඇහැළියගොඩ | මාදොල හා 137 බී දිවුරුම්පිටිය | දිව්රුම්පිටිය වත්ත | 138039m 190805m |
| 09 | බුලත්කොහුපිටිය | කිරිපෝරුව | කිරිපෝරුව | නො. 03 කොටස |
| 10 | | නෙව්ස්මියර් ඉහළ | නෙව්ස්මියර් ඉහළ | අංක 01 කොටස |
| 11 | | නෙව්ස්මියර් ඉහළ | නෙව්ස්මියර් ඉහළ | අංක 05 |
| 12 | | උඩපොත | කළුපහන වත්ත | අරන්දර කොටස |
| 13 | | 128 පූනාහැල | ඇඳුරාපොලවත්ත | බටහිර කොටස |
| 14 | දැරණියගල | වත්තේගෙදර | ඉලුක්තැන්න | - |

(iii) ආපදා තත්ත්ව වාර්තා අනුව නාය යෑම් හා නාය යෑම් අවදානම් හේතුවෙන් අවතැන් වූවන් ලෙස පවුල් 4853ක ප්‍රමාණයක් හඳුනා ගෙන ඇත. මෙම පිරිස කඳවුරුගත කිරීම් සිදු කර පිසූ ආහාර, වියළි සලාක, අත්‍යවශ්‍ය වෙනත් සහනාධාර ද්‍රව්‍ය ලබා දීම් සිදු කළ අතර, ඉහත හඳුනා ගත් පවුල් අතරින් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් කරන ලද මූලික භූ පරීක්ෂණ මඟින් අධි අවදානම් හා නැවත පදිංචි කළ යුතු පවුල් සංඛ්‍යාව 1965ක් වශයෙන් හඳුනා ගෙන ඇත.

(iv) ඉහත හඳුනා ගත් අධි අවදානම් පවුල් 1965 අතරින් පවුල් 1941ක් සඳහා 2016.07.26වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/16/1457/715/012 සහ 2017.04.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක

අමප/17/0709/715/009 අනුව පදිංචිය සඳහා පහත සඳහන් පරිදි නිවාස ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

(අ) රාජ්‍ය අනුග්‍රහය හා ප්‍රතිලාභ ශ්‍රම දායකත්වය යටතේ රජය මගින් වෙන් කර දුන් ඉඩම් කොටස්වල හා තම පුද්ගලික ඉඩමෙහි පවුල් 997ක් සඳහා නිවාස ඉදිවෙමින් පවතී.

(ආ) නිවසක් සහිත ඉඩමක් තමා විසින් මිල දී ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරන ලද පවුල් 110ක් සඳහා විශේෂ නිර්ණායක යටතේ ගෙවීම් කිරීමට ද පියවර ගෙන ඇත.

(ඇ) පුද්ගලික / රාජ්‍ය නොවන සංවිධාන අනුග්‍රහය යටතේ නිවාස 201ක් ඉදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, ඒ අතරින් පවුල් 114ක් නිවාසවල පදිංචි කරවීමද පවුල් 17ක් නිවාස ඉදි කිරීම් අවසන්ව පදිංචි කිරීමට නියමිතවද, පවුල් 70ක් සඳහා ඉඩම් හඳුනා ගැනීම හා හඳුනා ගත් ඉඩම්වල නිවාස ඉදි කිරීම් ආරම්භ කිරීමට ද පියවර ගෙන ඇත.

(v) ඉහත පරිදි පදිංචි කිරීම් සිදුවන අතර, ස්ථිර පදිංචිය අවසන් කළ පවුල් හැර ඉතිරි පවුල් තම ඥාති නිවෙස්වල හා ඉදි කිරීම සිදුවන රජයේ ඉඩම්වල අර්ධ තාවකාලික නිවාස වෙත යොමු කර ඇත. තවද අරණායක හා බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පිළිවෙළින් ආරක්ෂිත තාවකාලික කුඩාරම් සහිත ස්ථාන 9ක් හා 6ක් වශයෙන් පදිංචි කර ඇත.

(vi ) නිවාස සකස් කිරීම සඳහා මෙතෙක් ක්‍රියාත්මක ක්‍රමවේදය වූයේ අදියර 5ක් යටතේ සම්පූර්ණ නිවාසය ඉදිකිරීමෙන් අනතුරුව පදිංචි කිරීම වුවත්, මෙම ක්‍රමයෙන් බැහැරව නව ක්‍රමවේදයක් යටතේ නිවාස ඉදිකිරීමත්, ඒ අනුව පදිංචිය කඩිනම් කිරීම සඳහාත් අදාළ ඉඩමෙහි සම්පූර්ණ කළ අත්තිවාරම මත වැසිකිළිය සහිතව එක් කාමරයක් ඉදිකොට පදිංචි කරවීමට පියවර ගෙන ඇත. මෙම ක්‍රමවේදය අනුව අවම වශයෙන් මාස 03ක කාලයක් තුළ වැඩ කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරන අතර නිවාස තැනීමට අදාළ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා තවදුරටත් පවතින ගැටලු නිරාකරණය කර ගැනීමට අවශ්‍ය පියවරද ගෙන ඇත. එකී ඉඩම් ගැටලු නිරාකරණය කොට අවසන් වීම සඳහා තවත් මාස 02ක පමණ කාලයක් ගතවනු ඇතැයිද ඉන් අනතුරුව එළඹෙන මාස 02ක කාලය තුළ පදිංචිය සඳහා අවශ්‍ය ඉදි කිරීම් අවසන් කිරීමටද හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

ඇමුණුම 01

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ග්‍රාම නිලධාරී වසම | වත්තේ නම | අවදානමට ලක් වූ ක්ෂේත්‍ර අංකය හෝ කොටස | ඉඩම් භාවිතය | අවදානම් තත්ත්වය | | වර්ගඵලය $m^2$ | අවදානම් නිවාස සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | නායයෑම් සිදු වූ | නායයෑම් සිදු විය හැකි | | අධි අවදානම් | මධ්‍ය අවදානම් |
| 01 | දෙහිඕවිට | 119 හල්ගොඩ | ඩෙන්ස්වර්ත් | 145612m 193592m (2014 රබර් වගාව) | රබර් | √ | | 1500 | 02 | 35 |
| 02 | දෙහිඕවිට | 115 බී බොරලන්කඩ | අයිලා | – | රබර් | | √ | | 06 | – |
| 03 | දෙහිඕවිට | 123 බටන්ගල | වුඩ්න්ඩ් | යෝගමුව | - | | √ | | 01 | 04 |
| 04 | දෙහිඕවිට හා ඇහැළියගොඩ | මාදොල හා 137 බී දිවුරුම්පිටිය | දිවුරුම්පිටිය වත්ත | 138039m 190805m | රබර් | | √ | | – | 11 |
| 05 | දෙහිඕවිට | මඩගම්මන | තලපිටිය වත්ත | 1984 හා 1986 රබර් | රබර් හා කුරුඳු | | √ | | – | 02 |
| 06 | දෙහිඕවිට | 123 බටංගල | ග්ලාසල් | 2008 කොටස | රබර් | √ (නායයෑම් 02) | | 1750 හා 300 | – | – |
| 07 | දෙහිඕවිට | 123 බටංගල | යෝගම | - | ඔයිල් පාම් | √ | | 2000 | – | – |
| 08 | දෙහිඕවිට | 122 ඒ රංගේගම | රංගේගම | 2015 කොටස | කුරුඳු | | √ | | – | – |
| 09 | බුලත්කොහුපිටිය | කිරිපෝරුව | කිරිපෝරුව | නොම්බර 03 කොටස | - | | √ | | 04 | – |
| 10 | බුලත්කොහුපිටිය | නෙව්ස්මියර් ඉහළ | නෙව්ස්මියර් ඉහළ | අංක 01 කොටස | - | | √ | | 03 | 01 |

2017/06/21

දිස්ත්‍රික් බලයලත් නිලධාරී
කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

[ගරු දුනේෂ් ගන්කන්ද මහතා]

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | බුලත්කොහුපිටිය | නෙව්ස්මියර් ඉහළ | නෙව්ස්මියර් ඉහළ | අංක 05 | – | | √ | | 03 | – |
| 12 | බුලත්කොහුපිටිය | උඩපොත | කළුපහන වත්ත | අරන්දර කොටස | තේ | √ | | 2000 $m^2$ | 16 | – |
| 13 | බුලත්කොහුපිටිය | 128 පූනාහැල | ඇදුරාපොල වත්ත | බටහිර කොටස | - | | √ | | 07 | 08 |
| 14 | දැරණියගල | වත්තේගෙදර | ඉලුක්තැන්න | - | රබර් | | √ | | 13 | 05 |

2017/06/21
දිස්ත්‍රික් [illegible]
කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

මුළුමනින්ම නිවාස විනාශ වුණු පවුල් 269ක් තිබෙනවා. දැනට අවුරුද්දකට වැඩි කාලයක් ගත වී තිබෙනවා. ඒ අනුව දැනට නිවාස කීයක් ලබා දී තිබෙනවාද?

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
මේ වන විට ඒ නිවාස ඉදි කෙරෙමින් පවතිනවා. මෙතැන වාර්තා වෙලා තිබෙනවා, දැනට ඒ නිවාස ටික ඉදිවෙමින් පවතිනවාය කියා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු ඇමතිතුමනි, ඒ වුණාට තවම එක නිවසක්වත් ලබා දීලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ඔව්, දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැනට නිවාස 80ක් පමණ හැදෙනවා. නමුත්, තවත් නිවාස 180ක පමණ අවශ්‍යතාවක් තිබෙනවා. එක වත්තක ගිය වර්ෂයේ මුල්ගලක් තබා තිබෙනවා. ඒ, දැනට මාස 8කට, 9කට කලින්. නමුත්, ඒවා තව වෙන තෙක් ආරම්භ කරලා නැහැ. එම නිසා ඉතාමත් කඩිනමින් මේ අවශ්‍යතාවන් ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. අඩුම තරමින් මුල්ගල තැබූ ඒවායේ වැඩ කටයුතුවත් ආරම්භ කරන්න කටයුතු කරන්න.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
ගරු කනක හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් මේ විධියට කටයුතු කරන්න. අපට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා නැවත එහි වාර්තාවක් ලබා දෙන්න. ඔබතුමා වාචිකව මේ සම්බන්ධයෙන් අපව දැනුවත් කරන එක අපට වටිනවා. ඒ අදාළ ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරි හරහා එන විස්තර ඇතුළත් එම වාර්තාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිර්දේශ ඇතුව නැවත අපේ අමාත්‍යාංශයට එවන්න. මොකද, සමහර අවස්ථාවලදී මේ ඉඩම්වල ගැටලු තිබෙන්න පුළුවන්.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු ඇමතිතුමනි, මුල්ගල් තබා තිබෙන නිවාසවත් හදා දෙන්න කියලා ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවෙනි වටය.

ප්‍රශ්න අංක 4 - 1114/'16-(1), ගරු චමින්ද විජේසිරි මහතා. එතුමා පැමිණ නැත. එතුමා වෙනුවෙන් එම ප්‍රශ්නය කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු අසනවාද? එම ප්‍රශ්නය අසන්න ගරු මන්ත්‍රීවරයෙකු නැති නිසා-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, වෙනත් දවසක ප්‍රශ්නය ඉදිරිපත් කරමු.

## පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි කර්මාන්තපුර : විස්තර

புத்தளம் மாவட்டக் கைத்தொழில் பேட்டைகள் : விபரம்

INDUSTRIAL ZONES IN PUTTALAM DISTRICT: DETAILS

1158/'16

**6. ගරු මුජිබුර් රහුමාන් මහතා (ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවට)**

(மாண்புமிகு முஜிபுர் ரஹுமான் - மாண்புமிகு அசோக்க பிரியந்த சார்பாக)

(The Hon. Mujibur Rahuman on behalf of the Hon. Ashoka Priyantha))

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි කර්මාන්තපුර සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තපුරවල නම් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම කර්මාන්තපුරවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව සහ එක් එක් කර්මාන්තශාලාවේ සේවයේ නියුතු සේවක පිරිස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි කර්මාන්තපුර තුළ නව කර්මාන්තශාලා ඇති කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் அமைந்துள்ள கைத்தொழில் பேட்டைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி கைத்தொழில் பேட்டைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) 2010ஆம் ஆண்டிலிருந்து இன்றுவரை மேற்படி கைத்தொழில் பேட்டைகளில் இயங்கும் கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை மற்றும் ஒவ்வொரு கைத்தொழிற்சாலையிலும் பணியாற்றுகின்ற ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iv) எதிர்வரும் காலத்தில் புத்தளம் மாவட்டத்தில் அமைந்துள்ள கைத்தொழில் பேட்டைகளில் புதிய தொழிற்சாலைகளை அமைப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House-

(i) the number of industrial zones situated in Puttalam District;

(ii) the names of aforesaid industrial zones;

(iii) separately, the number of factories that are operative in aforesaid industrial zones and the number of employees employed in each aforesaid factory from the year 2010 up to now; and

(iv) the measures taken to establish new factories in industrial zones of Puttalam District in time to come?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 03කි.

(ii) 1. දංකොටුව කර්මාන්තපුරය

2. නුරාණි කර්මාන්තපුරය

3. පුත්තලම කර්මාන්තපුරය

(iii) * 2010 වර්ෂයේ සිට මේ දක්වා එම කර්මාන්තපුරවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව පහත දැක්වේ.

| කර්මාන්තපුරය | කර්මාන්තශාලා සංඛ්‍යාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
| දංකොටුව කර්මාන්තපුරය | 55 | 38 | 37 | 37 | 36 | 35 | 36 | 35 |
| නුරාණි කර්මාන්තපුරය | 4 | 3 | 5 | 5 | 3 | 3 | 2 | 04 |
| පුත්තලම කර්මාන්තපුරය | - | 1 | 2 | 2 | 1 | 1 | 3 | 03 |

* එක් එක් කර්මාන්තශාලාවේ සේවයේ නියුතු සේවක පිරිස

1. දංකොටුව කර්මාන්තපුරය

දංකොටුව කර්මාන්තපුරයේ 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ වර්ෂවලදී, ඒ ඒ වර්ෂයේ දෙසැම්බර් 31වැනි දින වන විට සේවා නියුක්තිය පහත දැක්වේ. එම වර්ෂවලට අදාළ එක් එක් කර්මාන්තශාලාවල සේවයේ නියුතු සේවක සංඛ්‍යාවට අදාළ දත්ත වාර්තා ලබා ගැනීම දුෂ්කර වී ඇත.

| සේවා නියුක්තිය | | | | |
|---|---|---|---|---|
| වර්ෂය | 2010 | 2011 | 2012 | 2013 |
| සේවා නියුක්තිය | 2,300 | 1,503 | 1,503 | 2,067 |

එම කර්මාන්තපුරයේ 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින වන විට එක් එක් කර්මාන්තශාලාවල සේවයේ නියුතු සේවක සංඛ්‍යාව පහතින් දැක්වේ.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

| අනු අංකය | කර්මාන්තශාලා | සේවා නියුක්තිය | | | |
|---|---|---|---|---|---|
| | | 2014 | 2015 | 2016 | 2017 |
| 1. | ගානට පොලිමර්ස් (පු) සමාගම | 20 | 20 | 20 | 20 |
| 2. | නෝර්ත් වෙස්ට් ෆිෂරි (පු) සමාගම | 44 | 44 | 44 | 53 |
| 3. | ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල්ස් (පු) සමාගම | 125 | 150 | 68 | 52 |
| 4. | රෝෂිත බහින් ඉන්ඩස්ට්‍රීස් (පු) සමාගම | 15 | 05 | 05 | 05 |
| 5. | ටරෙඩස්ඩිරෙක්ට් සමාගම | 25 | 15 | 15 | 20 |
| 6. | ක්‍රියේටිව් පොලිමැටස් සමාගම | 62 | 62 | 62 | 70 |
| 7. | ඩීපීඑස්එල් ඉන්ඩස්ට්‍රීස් (පු) සමාගම | 23 | 23 | 23 | 16 |
| 8. | යුනික් ඉන්ජිනියරින් (පු) සමාගම | 272 | 272 | 272 | 360 |
| 9. | සොනික් ස්ටීල් ඉන්ඩස්ට්‍රීස් (පු) සමාගම | 83 | 83 | 83 | 125 |
| 10. | රොක්නල් එන්ටප්‍රයිසස් (පු) සමාගම | 15 | 15 | 15 | 09 |
| 11. | යූනියන් ඇපරල් (පු) සමාගම } | 874 | 874 | 874 | 385 |
| 12. | යූනියන් නෝර්ත් (පු) සමාගම } | | | | |
| 13. | බිනෝ ටයර්ස් (පු) සමාගම | 22 | 22 | 22 | 22 |
| 14. | සෙන්ට් ඇන්ස් රබර් ගුඩ්ස් මැනියුෆැක්චරස් (පු) සමාගම | 23 | 23 | 23 | 23 |
| 15. | ක්ලින්කෝ රබර් මෝල්ඩින්ස් (පු) සමාගම | 22 | 22 | 22 | 25 |
| 16. | ටී.එන්.ග්ලෝබල් (පු) සමාගම | 13 | 10 | 10 | 09 |
| 17. | ටීඑන්ජී පැකේජින් (පු) සමාගම | 22 | 25 | 25 | 12 |
| 18. | ටෝකියෝ ටයර් (පු) සමාගම | 20 | 20 | 03 | 03 |
| 19. | හීරෝ සිපර්ස් ඉන්ටනැෂනල් (පු) සමාගම | 15 | 06 | 06 | 06 |
| 20. | හීරෝ සිපර්ස් මැනියුෆැක්චරස් (පු) සමාගම | 110 | 144 | 144 | 144 |
| 21. | කැන් රෝකොයාර් (පු) සමාගම | 45 | 45 | 45 | 20 |
| 22. | එම්.ආර්.එෆ් ලංකා (පු) සමාගම | 51 | 52 | 52 | 46 |
| 23. | ග්‍රීන් කොයා (පු) සමාගම | 12 | 12 | 12 | 25 |
| 24. | මරිෂා කොකෝ ප්‍රොඩක්ට්ස් (පු) සමාගම | 13 | 15 | 15 | 15 |
| 25. | එන් චන්ද්‍රරත්න කන්ස්ට්‍රක්ටර්ස් (පු) සමාගම | 12 | 12 | 12 | 12 |
| 26. | මර්චන්ට් ලංකා (පු) සමාගම | 40 | 40 | 40 | 40 |
| 27. | වින්ඩෝ (පු) සමාගම | 10 | 10 | 10 | 04 |
| 28. | සජීව කන්වෙයර් වර්ක්ස් | 13 | 13 | 13 | 22 |
| 29. | නෝර්ත් වෙස්ට් මැරීන්ලංකා (පු) සමාගම | 15 | 15 | 15 | 30 |
| 30. | බෙල් ගෲප් (පු) සමාගම | 45 | 45 | 45 | 28 |
| 31. | හීරෝ නේවර් ප්‍රොඩක්ට්ස් (පු) සමාගම | 55 | 55 | 70 | 165 |
| 32. | එස්.ඩී.කේ. කන්ස්ට්‍රක්ෂන්ස් (පු) සමාගම | 40 | 40 | 40 | 40 |
| 33. | ජයින්දි එක්ස්පෝට් (පු) සමාගම | ආරම්භ කර නොමැත | 185 | 185 | 341 |
| 34. | නවලෝක ස්ටීල් ඉන්ඩස්ට්‍රීස් (පු) සමාගම | ආරම්භ කර නොමැත | 71 | 71 | 140 |
| 35. | ආර් පී ඉන්ඩස්ට්‍රීස් | ආරම්භ කර නොමැත | | | 50 |
| | එකතුව | 2,156 | 2,445 | 2,361 | 2,337 |

2. නූරාණි කර්මාන්තපුරය

නූරාණි කර්මාන්තපුරයේ 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ වර්ෂවලදී, ඒ ඒ වර්ෂයේ දෙසැම්බර් 31වැනි දින වන විට සේවා නියුක්තිය පහත දැක්වේ. එම වර්ෂවලට අදාළ එක් එක් කර්මාන්තශාලාවල සේවයේ නියුතු සේවක සංඛ්‍යාවට අදාළ දත්ත වාර්තා ලබා ගැනීම දුෂ්කර වී ඇත.

| සේවා නියුක්තිය | | | | |
|---|---|---|---|---|
| වර්ෂය | 2010 | 2011 | 2012 | 2013 |
| සේවා නියුක්තිය | 610 | 386 | 800 | 325 |

එම කර්මාන්තපුරයේ 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂයේ දෙසැම්බර් 31වැනි දින වන විට ඒ ඒ කර්මාන්තශාලාවල සේවයේ නියුතු සේවක සංඛ්‍යාව පහතින් දැක්වේ.

| අනු අංකය | කර්මාන්තායතනය | වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | 2014 | 2015 | 2016 | 2017 |
| 1 | කින් ඇපරල් සර්විසස් ( පුද් ) සමාගම | 230 | 178 | 230 | අවලංගු කර ඇත |
| 2 | ඉන්ඩස්ට්‍රියල් බිල්ඩින් සිස්ටම්ස් ( පුද් ) සමාගම | 40 | 26 | 28 | 28 |
| 3 | දිල්ෂාන් කොන්ක්‍රීට් වර්ක්ස් (පුද්) සමාගම | 16 | 07 | අක්‍රිය තත්වයේ ඇත. | |
| 4 | අඩීම් යුනිෆෝම් (පු) සමාගම | ආරම්භ කර නොමැත | | | 230 |
| 5 | ඉවෝන් ලංකා (පුද්) සමාගම | ආරම්භ කර නොමැත | | | 07 |
| 6 | හියුපර් සහ සමාගම | ආරම්භ කර නොමැත | | | 60 |
| | එකතුව | 286 | 211 | 258 | 325 |

3. පුත්තලම කර්මාන්තපුරය

පුත්තලම කර්මාන්තපුරයේ 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂයේ දෙසැම්බර් 31වැනි දින වන විට ඒ ඒ කර්මාන්තශාලාවල සේවයේ නියුතු සේවක සංඛ්‍යාව පහතින් දැක්වේ.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | සේවා නියුක්තිය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 20 |
| 1 | සුප්‍රීම් පෙට්‍රෝ (පු) සමාගම | ආරම්භ කර නොමැත | 20 | 20 | 20 | 20 | 40 | 40 | 40 |
| 2 | ලිහිණි ස්ටීල් (පු)සමාගම | ආරම්භ කර නොමැත | ආරම්භ කර නොමැත | 45 | 45 | තාවකාලිකව වසා ඇත. | | | |
| 3 | එම්.බී. ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම | ආරම්භ කර නොමැත. | | | | | | 30 | 30 |
| 4 | ෆයින් ඇෂ් (පුද්) සමාගම | ආරම්භ කර නොමැත | | | | | | 25 | 25 |
| | එකතුව | -- | 20 | 65 | 65 | 20 | 40 | 95 | 95 |

(iv) 1. දංකොටුව කර්මාන්තපුරය

මේ වන විට දංකොටුව කර්මාන්තපුරයේ සියලුම ඉඩම් කැබලි ආයෝජකයන් වෙත විවිධ ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දී ඇත.

2. නූරාණි කර්මාන්තපුරය

මෙම කර්මාන්තපුරයෙහි එක් ඉඩම් කොටසක් පමණක් ඉතිරිව පවතින අතර, බෝට්ටු නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා ලබා දීමට වයඹ ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින් අනුමත කර ඇත. එය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

3. පුත්තලම කර්මාන්තපුරය

මෙම කර්මාන්තපුරයෙහි අක්කර 13යි, පර්චස් 8ක ඉඩම් ප්‍රමාණයක් හිස්ව පවතී. එම ඉඩම් කොටස් ද නව ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දීමට මේ වන විටත් පුවත් පත් දැන්වීම් මඟින් ආයෝජකයන් දැනුවත් කර ඇති අතර, ඒ අනුව නව ව්‍යාපෘති සඳහා යෝජනා මෙම අමාත්‍යාංශය වෙත ලැබෙමින් පවතී. ඒ අතුරින් වඩාත් සුදුසු ව්‍යාපෘති සඳහා අදාළ අනුමැතීන් යටතේ ඉඩම් කොටස් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

***[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]***

*[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*

*[This reply is also placed in the Library.]*

## උකස් කළ රන් භාණ්ඩ සඳහා පොලී සහනය: මාතර දිස්ත්‍රික්කය

### அடகுவைக்கப்பட்ட தங்க நகைகளுக்கான வட்டிச் சலுகை: மாத்தறை மாவட்டம்

### INTEREST-WAIVER CONCESSION ON PAWNED GOLD JEWELLERY: MATARA DISTRICT

1301/’16

**8.** ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) වර්තමාන රජයේ "දින 100" වැඩසටහනට සමගාමීව අය වැය යෝජනාවක් ලෙස රාජ්‍ය බැංකු වෙත උකස් කරනු ලැබූ රන් භාණ්ඩ නිදහස් කර ගැනීමේදී අය කරනු ලබන පොලී මුදල් කපාහරින බවට වූ පොරොන්දුවට අනුව 2015 සහ 2016 වර්ෂයන්හි රන් භාණ්ඩ නිදහස් කරගෙන ඇති මාතර දිස්ත්‍රික්කයේ ගනු දෙනුකරුවන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒ සඳහා වූ රජයේ සහනාධාරයේ මූල්‍ය අගය කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් මුදල මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක එක් එක් රාජ්‍ය බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වර්ෂ 2013 සිට 2016 දක්වා රන් පොලී අනුපාතය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පසු ගිය ජනාධිපතිවරණයේදී ප්‍රචාරක තේමාවක් බවට පත් කරගත් ස්වර්ණාභරණ උකස් කිරීම, හුදු ප්‍රචාරක ව්‍යාපෘතියකින් ඔබ්බට යාමක් සිදුවී නොමැති බව පිළිගන්නේද;

(ii) පොරොන්දු වූ පරිදි උකස් කරනු ලැබූ ස්වර්ණාභරණ නිදහස් කර ගැනීමේදී පොලී සහනයන් වහාම ලබා දීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நடப்பு அரசாங்கத்தின் "100 நாள்" வேலைத்திட்டத்திற்கு நேரொத்த வகையில் வரவு செலவுத்திட்ட முன்மொழிவாக அரச வங்கிகளில் அடகு வைக்கப்பட்டுள்ள தங்க நகைகளை மீட்கின்றபோது அறவிடப்படுகின்ற வட்டித் தொகை வெட்டிவிடப்படுமென வழங்கப்பட்ட வாக்குறுதியின் பிரகாரம் 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் தங்க நகைகளை மீட்டுள்ள மாத்தறை மாவட்ட வாடிக்கையாளர்களின் எண்ணிக்கை ஒவ்வொரு வருடத்தின் பிரகாரம் தனித்தனியாக எத்தனையென்பதையும்;

(ii) இதற்கான அரசாங்க நிவாரணத்தின் நிதிப் பெறுமதி எவ்வளவென்பதையும்;

(iii) மேற்படி (ii) இல் குறிப்பிடப்பட்டுள்ள தொகையானது மாத்தறை மாவட்டத்தில் இயங்கி வருகின்ற ஒவ்வொரு அரச வங்கியின் பிரகாரம் தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iv) 2013 தொடக்கம் 2016ஆம் ஆண்டுவரை தங்க நகைகளுக்கான வட்டி வீதமானது ஒவ்வொரு வருடத்திற்கேற்ப தனித்தனியாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கடந்த சனாதிபதித் தேர்தலின்போது விளம்பரத் தொனிப்பொருளாக அமைத்துக் கொள்ளப்பட்ட தங்க நகைகளை அடகுவைத்தல் என்பது வெறுமனே விளம்பரக் கருத்திட்டத்திற்கு அப்பால் செல்லவில்லையென்பதை ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(ii) வாக்குறுதியளிக்கப்பட்டவாறு அடகு வைக்கப்பட்ட தங்க நகைகளை மீட்கின்றபோது வட்டிச் சலுகைகளை உடனடியாகப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise Development:

(a) Will he inform this House-

(i) how many customers from the Matara District redeemed their gold jewellery in the years 2015 and 2016 separately as per the pledge to write off the interest charged on redemption of gold jewellery pawned at State banks given as a Budget Proposal side by side with the "100 Day Programme" of the present Government;

(ii) what it is worth in terms of the monetary value of the Government's subsidy for it;

(iii) what the values of the portions of the subsidy referred to in (ii) above were, separately in respect of each State-owned bank in operation in the Matara District; and

(iv) what the interest rates on gold loans are, separately in respect of each year from 2013 to 2016?

(b) Will he also inform this House-

(i) whether he admits that the promise to waive interest on gold loans, which had been made a campaign platform during the last Presidential Election, has not gone beyond a mere propaganda campaign; and

(ii) whether he will take steps to grant the interest-waiver concessions at redemption of pawned gold jewellery as promised?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***** *සභාමේසය මත තබන ලද පිළිතුර:*
*** *சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*** *Answer tabled:*

(අ) (i)

| | රාජ්‍ය බැංකුවේ නම | 2015 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 2065 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ලංකා බැංකුව | 59 | නැත |
| 02 | මහජන බැංකුව | 02 | නැත |
| 03 | නිවාස සංවර්ධන මූල්‍ය සමාගම | නැත | නැත |
| 04 | ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුව | නැත | නැත |
| 05 | ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව | නැත | නැත |
| 06 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 1,225 | නැත |
| 07 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | නැත | - |
| 08 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 30 | නැත |

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) රුපියල් මිලියන 94.07

(iii)

| | රාජ්‍ය බැංකුවේ නම | මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක රජයේ සහනාධාරයේ මූල්‍ය අගය (රු) |
|---|---|---|
| 01 | ලංකා බැංකුව | 209,773.64 |
| 02 | මහජන බැංකුව | 366.23 |
| 03 | නිවාස සංවර්ධන මූල්‍ය සමාගම | අදාළ නැත |
| 04 | ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුව | අදාළ නැත |
| 05 | ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව | අදාළ නැත |
| 06 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2,337,283.24 |
| 07 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | අදාළ නැත |
| 08 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 120,591.33 |

(iv)

| රාජ්‍ය බැංකුව | රන් පොලී අනුපාතය | | | |
|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 |
| ලංකා බැංකුව | 17.5% | 16.5% 16% - 12% ඇප සහතික ක්‍රමය 15% | 12% | 12% 14%, 15%, 15.5%, 16.5% |
| මහජන බැංකුව | 19%, 18% | 18%, 16%, 12% 15% | 12%, 15% | 12% 13.5%, 15%, 16%, 17% |
| නිවාස සංවර්ධන මූල්‍ය සමාගම | 20% | 18% | 16% | 18% |
| ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුව | 11.5% | 11.5% | 11.5% | 11.5% 13.5% 15% 16%, 17% |
| ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව | 18% | 18% 12% | 12% 15% | 15% |
| ජාතික ඉතිරිකිරීම්බැංකුව | 18% | 16.5% | 16% | 12.5% |
| රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව | අදාළ නොවේ. | | | |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 20% | 20%, 18%, 16%, 15%, 12% | 12% | 12%, 13%, 15%, 16%, 17%, 18% |

(ආ) (i) නැත.

(ii) පියවර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

***[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]***

*[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*

*[This reply is also placed in the Library.]*

## වයස අවුරුදු 12-18 අතර මුස්ලිම් දැරියන්ගේ විවාහ ලියාපදිංචි කිරීම්: විස්තර

## 12-18 வயதுக்கிடைப்பட்ட முஸ்லிம் சிறுமிகளின் விவாகப் பதிவு: விபரம்

## REGISTRATION OF MARRIAGES OF MUSLIM GIRLS BETWEEN AGES 12-18: DETAILS

1500/'16

**11.ගරු මුජිබුර් රහුමාන් මහතා (ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා වෙනුවට)**

(மாண்புமிகு முஜிபுர் ரஹுமான் - மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)

(The Hon. Mujibur Rahuman on behalf of the Hon. M.H.M. Salman)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ වයස අවුරුදු 12-18 අතර පසුවන මුස්ලිම් දැරියන් සඳහා සිදුකරන ලද විවාහ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) முஸ்லிம் விவாக மற்றும் விவாகரத்துச் சட்டத்தின்கீழ் 12-18 வயதுக்கு இடைப்பட்ட முஸ்லிம் சிறுமிகளுக்கு மேற்கொள்ளப்பட்ட விவாகப் பதிவுகளின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத்திற்கும் அமைய தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House, separately, in terms of each district, of the number of marriage registrations performed in connection with the Muslim girls of the ages between 12 and 18, in terms of Muslim Marriages and Divorces Act?

(b) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)

(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

වයස අවුරුදු 12-18 අතර පසුවන මුස්ලිම් දැරියන් සඳහා සිදු කරන ලද විවාහ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් පහත පරිදි දැක්වේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වයස අවු.12-18 ත් අතර මුස්ලිම් දැරියන් සඳහා සිදු කරන ලද විවාහ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව (2014-2016) | | | පළාත |
|---|---|---|---|---|---|
| | | 2014 | 2015 | 2016 | |
| 01. | කොළඹ | 287 | 251 | 250 | බස්නාහිර |
| 02. | ගම්පහ | 117 | 110 | 132 | |
| 03. | කළුතර | 83 | 84 | 100 | |
| 04. | කුරුණෑගල | 79 | 64 | 92 | වයඹ |
| 05. | පුත්තලම | 117 | 125 | 114 | |
| 06. | අනුරාධපුරය | 54 | 53 | 49 | උතුරුමැද |
| 07. | පොළොන්නරුව | 29 | 30 | 48 | |
| 08. | යාපනය | Nil | 1 | 4 | උතුර |
| 09. | කිලිනොච්චි | Nil | Nil | Nil | |
| 10. | මුලතිව් | 1 | 4 | 3 | |
| 11. | වව්නියාව | 7 | 5 | 14 | |
| 12. | මන්නාරම | 4 | 3 | 6 | |
| 13. | මඩකලපුව | 190 | 184 | 163 | |
| 14. | ත්‍රිකුණාමලය | 275 | 310 | 316 | නැගෙනහිර |
| 15. | අම්පාර | 192 | 224 | 264 | |
| 16. | ගාල්ල | 33 | 56 | 54 | දකුණ |
| 17. | මාතර | 20 | 14 | 20 | |
| 18. | හම්බන්තොට | 29 | 25 | 30 | |
| 19. | මහනුවර | 90 | 68 | 46 | මධ්‍යම |
| 20. | මාතලේ | 30 | 20 | 17 | |
| 21. | නුවරඑළිය | 3 | 14 | 2 | |
| 22. | බදුල්ල | 37 | 15 | 19 | ඌව |
| 23. | මොණරාගල | 1 | 2 | 2 | |
| 24. | කෑගල්ල | 18 | 40 | 21 | සබරගමුව |
| 25. | රත්නපුර | 22 | 15 | 11 | |

(ආ) අදාළ නොවේ.

***[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]***
*[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*
*[This reply is also placed in the Library.]*

## මන්ඩයික්කල්ලාරු පාලම ප්‍රතිසංස්කරණ නොකිරීම : හේතු
### மண்டைக்கல்லாறு பாலம் மறுசீரமைக்கப்படாமை: காரணம்
### NON-RECONSTRUCTION OF MANDAIKKALARU BRIDGE: REASONS

1577/'17

**14. ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය (ගරු එස්. ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா - மாண்புமிகு சி. சிறீதரன் சார்பாக)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa on behalf of the Hon. S. Shritharan)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2010 වසරේදී යාපනය - මන්නාරම A-32 මාර්ගය ප්‍රතිසංස්කරණය කළ බවත්;

(ii) එසේ වුවද, එම මාර්ගයේ පූනරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති මන්ඩයික්කල්ලාරු පාලම ප්‍රතිසංස්කරණය නොකළ බවත්;

(iii) මෙම පාලම ඔස්සේ මන්නාරම, යාපනය, මුලතිව් සහ කිලිනොච්චි යන ප්‍රදේශවලට ගමන් කළ යුතු බවත්;

(iv) ඉලුප්පත්කඩවයි, මුලංගාවිල් මූලික රෝහලේ හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් මෙම මාර්ගය ඔස්සේ යාපනය හා කිලිනොච්චි රෝහල්වලට රැගෙන යාමේදී විශාල ගැටලු මතුවී ඇති බවත්;

(v) පාලම අබලන් වී ඇති බැවින් පසු ගිය වර්ෂා කාලවලදී මෙම මාර්ගය ගමන් කිරීමට නොහැකි පරිදි සති කිහිපයක් අවහිර වී තිබූ බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) පාලම ඉදිකරන බවට දැන්වීම් පුවරුවක් සවිකර අවශ්‍ය ද්‍රව්‍ය එහි ගෙනැවිත් ඇතත්, මෙතෙක් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(ii) මන්ඩයික්කල්ලාරු පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙන්කරන ලද මුදලට සිදු වූයේ කුමක්ද;

(iii) එම මුදල ආපසු හරවා යවා තිබේද;

(iv) එසේ නම්, එයට වග කිව යුත්තේ කවුරුන්ද;

(v) මෙම පාලම ප්‍රතිසංස්කරණය කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டில் யாழ்ப்பாணம் - மன்னார் A-32 வீதி மறுசீரமைக்கப்பட்டதென்பதையும்;

(ii) ஆயினும், அந்த வீதியில் பூநகரி பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள மண்டைக்கல்லாறு பாலம் மறுசீரமைக்கப்படவில்லை என்பதையும்;

(iii) இந்தப் பாலத்தின் ஊடாக மன்னார், யாழ்ப்பாணம், முல்லைத்தீவு, கிளிநொச்சி ஆகிய பிரதேசங்களுக்கு பயணிக்க வேண்டுமென்பதையும்;

(iv) இலுப்பைக்கடவை, முழங்காவில் ஆதார வைத்தியசாலையில் அவசர சிகிச்சைகள் தேவைப்படுகின்ற நோயாளிகள் இந்த வீதியின் ஊடாக யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சி வைத்தியசாலைகளுக்கு எடுத்துச் செல்லப்படுகையில் பாரிய சிக்கல்கள் தோன்றியுள்ளனவென்பதையும்;

(v) பாலம் சீரழிந்துள்ளமையால் கடந்த மழைக்காலங்களில் இந்த வீதி பயணஞ்செய்ய இயலாதவாறு பல வாரங்கள் தடைப்பட்டிருந்ததென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) பாலம் நிர்மாணிக்கப்படுவதாக அறிவித்தல் பலகையொன்று பொருத்தப்பட்டு அவசியமான பொருட்கள் அங்கு கொண்வரப்படுள்ளபோதிலும் இற்றைவரை மறுசீரமைப்புப் பணிகள் ஆரம்பிக்கப்படாமைக்கான காரணங்கள் யாவை;

(ii) மண்டைக்கல்லாறு பாலத்தை மறுசீரமைப்பதற்காக ஒதுக்கப்பட்ட பணத்திற்கு என்ன நேர்ந்தது;

(iii) அந்தப் பணம் மீளத் திருப்பி அனுப்பப்பட்டுள்ளதா;

(iv) ஆமெனில் அதற்கு பொறுப்புக்கூற வேண்டியவர்கள் யாவர்;

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

(V ) இந்த பாலம் மறுசீரமைக்கப்படும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Is he aware that-

(i) the Jaffna-Mannar A-32 Road was renovated in the year 2010;

(ii) however, the Mandaikkalaru Bridge which is situated in the section of the road that runs through the Punerin Divisional Secretary's Division was not repaired;

(iii) the aforementioned bridge must be crossed to travel towards Mannar, Jaffna, Mullaitivu and Kilinochchi areas;

(iv) major issues have cropped up when transporting patients of the Mulangavil, Iluppaikadawai Base Hospital, who require emergency treatment, to Jaffna and Kilinochchi Hospitals; and

(v) the aforementioned road was obstructed and could not be used during the past rainy seasons due to the dilapidated condition of the bridge?

(b) Will he inform this House-

(i) the reasons for not starting repair work on the aforementioned bridge although a notice board which states that the bridge is under construction has been installed and supplies required for construction have been brought to the location;

(ii) as to what happened to the money allocated for the reconstruction of the Mandaikkalaru Bridge;

(iii) whether the aforesaid money was returned;

(iv) if so, the names of persons who are responsible for such action; and

(v) the date on which the aforesaid bridge will be reconstructed?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) මෙම මාර්ගය පහසු මාර්ගය වුවද වෙනත් විකල්ප මාර්ග ද පවතී.

(iv) දැනට මෙම ස්ථානයේ පැරණි පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරීම ආරම්භ කර ඇත. ඉදිකිරීම් කටයුතු අවසන් වන තෙක් පැරණි පාලමේ ගමන් කිරීමට සිදුවීම නිසා අපහසුතා ඇති විය හැකිය.

(v) 2016 නොවැම්බර් මාසයේ සිට පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

(ආ) (i) 2016 නොවැම්බර් ආරම්භ කර ඇති ඉදිකිරීම් කටයුතු දැනට සිදුවෙමින් පවතී.

(ii) නව පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහාම යොදා ගැනේ.

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(v) මෙම පාලමේ වැඩ කටයුතු 2016 වසරේ නොවැම්බර් මස 24වන දින JICA අරමුදල් යටතේ ආරම්භ කළ අතර, මේ වන විටත් මෙහි කටයුතු සිදු වෙමින් පවතින අතර, 2018 වසරේ අගෝස්තු මස අග වන විට පාලමේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නියමිතව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මහතා. Hon. Member, I would like to bring to your kind attention that we might have difficulties in allowing tomorrow's Question under Standing Order No.23 (2). We will do our best to help you, but please restrict the number of Questions raised under Standing Order No. 23(2).

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Okay.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ත්‍රී රෝද රථ රියැදුරන්ට එරෙහි පැමිණිලි
### முச்சக்கரவண்டிச் சாரதிகளுக்கெதிரான முறைப்பாடுகள்
### COMPLAINTS AGAINST THREE-WHEELER DRIVERS

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, இன்று எமது நாட்டில் வேலையில்லாப் பிரச்சினையை ஓரளவு தீர்க்கின்ற வகையிலும் பொதுமக்களது போக்குவரத்துத் தேவையைப் போதியளவு பூர்த்தி செய்யும் வகையிலும் முச்சக்கர வண்டிகளின் போக்குவரத்துப் பணிகள் காணப்படுகின்ற அதேநேரம், சுற்றுலாப் பயணிகளின் கணிசமான அளவு போக்குவரத்துத் தேவையினையும் அவை பூர்த்தி செய்து வருகின்றமை குறிப்பிடத்தக்கது. இந்த வகையில், சுமார் 1.3 மில்லியன் முச்சக்கர வண்டிகள் எமது நாட்டில் பாவனையில் இருப்பதாகக் கூறப்படுகின்ற நிலையில், 400,000 வாடகை

முச்சக்கர வண்டிகள் எமது நாட்டில் காணப்படுவதாக மோட்டார் வாகனத் திணைக்களத் தகவல்கள் தெரிவிக்கின்றன.

எமது நாட்டைப் பொறுத்தவரையில், முச்சக்கர வண்டிப் போக்குவரத்தானது சுற்றுலாத்துறை சார்ந்து முக்கிய பங்கினை வகித்துவருகின்ற நிலையில், "இவ்வருடம் 2.5 மில்லியன் சுற்றுலாப் பயணிகளை கவர்ந்திழுப்பதே இலக்கு" என இலங்கை சுற்றுலா அதிகாரசபை தெரிவித்திருக்கிறது. கடந்த யூன் மாதம் 26ஆம் திகதி கொழும்பிலுள்ள அமெரிக்கத் தூதரகம் விடுத்துள்ள பாதுகாப்புத் தகவல்களில், அமெரிக்கப் பெண் பயணிகள் மீதான பொருத்தமற்ற தொடுகைகள் கொழும்புப் பகுதிகளில் காணப்படுவதாகவும் இவ்வாறான சம்பவங்களில் முச்சக்கர வண்டிகளின் சாரதிகள் தொடர்பு பட்டுள்ளதாகவும் தெரிவித்துள்ளது. இது முச்சக்கர வண்டிப் போக்குவரத்துத்துறையில் உள்ள அனைத்துச் சாரதிகளையும் அவமதிக்கின்ற, எமது சுற்றுலாத்துறையைப் பாதிப்படையச் செய்கின்ற செய்தியாகவே அமைந்துள்ளது.

2017ஆம் ஆண்டின் ஜனவரி மாதம் முதல் கடந்த யூன் மாதம் வரையிலான காலப்பகுதிக்குள் இலங்கைக்கு வருகைதந்துள்ள சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கையின் படி, அமெரிக்காவிலிருந்து சுமார் 28,139 பயணிகளே வருகை தந்துள்ளனர். அந்த வகையில் இலங்கைக்கான சுற்றுலாப் பயணிகளின் வருகையில் அமெரிக்கா 9ஆவது இடத்தையே வகிக்கின்றது. முச்சக்கரவண்டிச் சாரதிகளுக்கு எதிராகப் பொலிஸில் செய்யப்பட்டுள்ள முறைப்பாடுகளில், 2016ஆம் ஆண்டு 4 முறைப்பாடுகளும் இந்த ஆண்டு இதுவரையில் 3முறைப்பாடுகளுமே கிடைத்துள்ளதாகப் பொலிஸ் ஊடகப் பேச்சாளர் தெரிவித்துள்ளாரெனத் தகவல்கள் தெரிவிக் கின்றன. இதில் 3 சம்பவங்கள் பாலியல் ரீதியிலான தொந்தரவுகள் என்றும் ஏனையவை மீற்றர் சம்பந்தப்பட்டவை என்றும் தெரிவிக்கப்படுகின்றது. அந்த வகையில் அமெரிக்கத் தூதரகத்தின் மேற்படி அறிவிப்பானது, இந்த நாட்டிலுள்ள 4,00,000 வாடகை முச்சக்கரவண்டிகளினதும் ஏனைய முச்சக்கரவண்டிகளினதும் சாரதிகளைக் கடுமையான பாதிப்புக்கு உள்ளாக்கியிருப்பதுடன், இலங்கையை வெளி நாட்டவர்களிடம் மலினப்படுத்தும் செயலாகவும் அமைந் துள்ளது. ஓரிரு சம்பவங்கள் நடந்திருந்தாலும் அதற்காக ஒட்டுமொத்த முச்சக்கரவண்டிகளின் சாரதிகளையும் இழிவு படுத்துகின்ற இச்செயல் கண்டிக்கத்தக்கதாகும்.

**கொழும்பிலுள்ள அமெரிக்கத் தூதரகம் விடுத்துள்ள மேற்படி பாதுகாப்புத் தகவல்களின் உண்மை நோக்கம் என்ன என்பது குறித்து விளக்க முடியுமா?**

மேற்படி எனது கேள்விக்கான பதிலை கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவாரென நம்புகின்றேன்.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, the Answer to that Question will be given tomorrow.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

That is fine. Thank you very much.

## ඛනිජ තෙල් වෘත්තීය සමිති වර්ජනය: අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## பெற்றோலிய தொழிற்சங்கங்களின் வேலைநிறுத்தம்: பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரின் கூற்று
## STRIKE ACTION BY TRADE UNIONS OF CEYLON PETROLEUM CORPORATION: STATEMENT BY PRIME MINISTER, MINISTER OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, මට මෙම අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙනවා.

ඛනිජ තෙල් බෙදා හැරීම අත්‍යවශ්‍ය සේවාවක් ලෙස නම් කිරීමේ ගැසට් නිවේදනය ඊයේ රාත්‍රියේ නිකුත් කළා. මේ සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය, ප්‍රතිපත්තිය හා දැක්ම මේ සභාවට පැහැදිලි කළ යුතු යැයි අප කල්පනා කළා. අප එසේ කරන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් හා ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ආරක්ෂා කිරීමට අපේ රජය සැමවිටම කැප වී සිටින නිසායි.

පසු ගිය කාලයේ එවැනි පිළිවෙතක් ක්‍රියාත්මක වුණේ නැහැ. රජයේ ප්‍රතිපත්තිමය තොරතුරු පමණක් නොව මූල්‍ය තොරතුරුද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. රාජපක්ෂ රෙජීමය සමයේ පාර්ලිමේන්තුව නිකම්ම නිකම් සීල් එකක් බවට පත් කර තිබුණා.

2015 ජනවාරි 08වෙනි දා විප්ලවයෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති ලෙස මේ රටේ බහුතර ජනතාව පත් කර ගත් පසු, අප නැවතත් ප්‍රජාතන්ත්‍රවාදී අගයන් රට තුළ ස්ථාපිත කරලීමට කටයුතු කළා. පාර්ලිමේන්තුව බල ගැන්වූවා.

එහි ප්‍රතිඵල ලෙස ජනතාවට නිදහසේ ජීවත්වීමේ, නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ලැබුණා. මේ අයිතියෙන් ප්‍රයෝජන ගත් යම් යම් කොටස් ඒ නිදහස් අයිතිය පාවිච්චි කරමින් පටු දේශපාලන අරමුණු මුදුන්පත් කර ගැනීමට උත්සාහ කළ අවස්ථා ගණනාවක්ද අප නිරීක්ෂණය කළා.

ඕනෑම වෘත්තීය කණ්ඩායමක් සිය වෘත්තියේ උන්නතිය සහ සුබසාධනය වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම්, අරගළ, විරෝධතා ව්‍යාපාර පිළිබඳ අපට කිසිදු ගැටලුවක් නැහැ. නමුත් කිසියම් පිරිසක් පදනම් විරහිතව, කිසිදු පිළිගත හැකි හේතු නොමැතිව රටේ සාමාන්‍ය ජන ජීවිතය කඩාකප්පල් කොට, රට අස්ථාවර භාවයට පත් කිරීමට අප ලබා දුන් නිදහස පාවිච්චි කරනවා නම් රජයක් හැටියට වගකීමෙන් යුතුව ක්‍රියා කිරීමට අප බැඳී සිටිනවා.

ඛනිජ තෙල් වෘත්තීය සමිති ඊයේ හදිසි වැඩ වර්ජනයක් ආරම්භ කළා. ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ නිල අදහස් දැක්වීම

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මෙසේයි. මෙහෙම කියන්නේ ඛනිජ තෙල් වෘත්තීය සමිති එකමුතුවේ කැඳවුම්කරු බන්දුල සමන් කුමාර මහතායි.

"ලිඛිතව ජනාධිපතිවරයා එකඟ වෙනවා නම්, අපි අනිවාර්යයෙන් වැඩ වර්ජනය නවත්තනවා. එහෙම නැතිව ජනාධිපතිතුමා එක්ක නොවෙයි, ශක්‍ර දේවේන්ද්‍රයා එක්කවත් අපි සාකච්ඡා පවත්වන්න එන්නෙ නෑ. ඒක අපේ තීරණය."

ගරු කථානායකතුමනි, අපේ රජය කිසිම විටෙක කිසිදු වෘත්තීය සමිතියක් සමඟ සාකච්ඡා ප්‍රතික්ෂේප කර නැහැ. ඛණිජ තෙල් වෘත්තීය සමිති සමඟ අපේ මැතිඇමතිවරුන් අවස්ථා ගණනාවකදී සාකච්ඡා පවත්වා තිබෙනවා. මම අප්‍රේල් 24 සහ ජූලි 13 යන දිනවල ඔවුන් සමඟ සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවලදී ඔවුන් ප්‍රධාන කරුණු තුනක් පිළිබඳව අවධාරණය කළා.

ඉන් පළමුවැන්න හම්බන්තොට තෙල් ටැංකි සංකීර්ණය පිළිබඳවයි. දෙවැන්න, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිළිබඳවයි. තුන්වැන්න, සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම සම්බන්ධවයි. ත්‍රිකුණාමලය තෙල් ටැංකි පිළිබඳව සිදු කෙරෙන මූලික සාකච්ඡාවලට වෘත්තීය සමිති නියෝජිතයන්ගේ අදහස් ලබා ගන්නා බව අප ඔවුන්ට දැනුම් දුන්නා. දැන් ඒ පිළිබඳ බරපතළ ගැටලුවක් නැහැ. අදාළ අවස්ථාවේදී සාකච්ඡා පිළිබඳ දැනුවත් කරලා, ඒ අදහසුත් අපි ඇතුළත් කරනවා.

මේ තෙල් ටැංකි පිළිබඳව හා බදු දීමේ ගිවිසුම පිළිබඳව දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතිනවා. එම නඩු තීන්දුවෙන් අනතුරුව මෙහි ඇති නීත්‍යානුකූල තත්ත්වය තවත් පැහැදිලි වෙනවා. සපුගස්කන්ද තෙල් පිරිපහදුව පිළිබඳ සංවර්ධන යෝජනා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමැතිතුමාට භාර දෙන ලෙස අප දැනුම් දී තිබෙනවා. ඒවා ලැබුණු පසුව අපි සලකා බලනවා.

හම්බන්තොට තෙල් ටැංකිවල අයිතිය ඇත්තේ ශ්‍රී ලංකා වරාය අධිකාරියටයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියට මේ අයිතිය ලබා දුන්නේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතායි. නමුත්, ඒ අවස්ථාවේ කිසිවෙක් විරෝධය පළ කළේ නැහැ. මේ තෙල් ටැංකිත් හම්බන්තොට වරායේ ණය ගෙවීමට ඇතුළත් වෙලා තිබෙනවා. දැන් ඛනිජ තෙල් වෘත්තීය සමිතිවල ඉල්ලීම වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයට යොමු කර තිබෙනවා.

හම්බන්තොට වරාය සඳහා අපි ගත්ත ණය ගෙවීමට මේ තෙල් ටැංකි ඇතුළත් කරන වැඩසටහනක් තමයි තිබුණේ. එම ණය ගෙවන්න වැඩ කටයුතු කරගෙන යනවා. ඒකේ සම්පූර්ණ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4යි. ඒකෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.1ක් ලංකාවට ලැබෙනවා. ඒ සියල්ල මේ වරාය උපයන්න ඕනෑ. එම නිසා වරාය හා නාවික කටයුතු ඇමැතිතුමා මේ සියල්ල ගැන හිතලා බලලා තමයි තීරණයක් ගන්නේ. ඒ කටයුතු සියල්ල අපි වරාය හා නාවික කටයුතු ඇමැතිතුමාට භාර දීලා තිබෙනවා. මොකද, අද එහි අයිතිය තිබෙන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට මිස වෙන කාටවත් නොවන නිසා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක චීන කොම්පැනියක්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අයිතිය තිබෙන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට. ඒක චීන කොම්පැනියක් නොවෙයි. මම දන්නේ නැහැ ඒක චීන කොම්පැනියක් කියලා මෙතුමා හිතන්නේ කොහොමද කියලා. එදා චීන කොම්පැනිය එක්ක ගිවිසුම අත්සන් කරපු කැබිනට් එකේ හිටපු ඇමැතිවරයෙක් නේ මෙහෙම කියන්නේ. දැන් මොනවාටද මෙතැනට වෙලා කෑ ගහන්නේ? [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි සභාවේ වැඩ කටයුතු කරමු. මේ ගැන වාද විවාද අවශ්‍ය වන්නේ නැහැ. ගරු අගමැතිතුමා කථා කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
රජයේ කිසිදු ක්‍රියා පිළිවෙතකින් තෙල් සංස්ථාවට අගතියක් හෝ හානියක් සිදු නොවන බවට මා වෘත්තීය සමිති හමුවේ සහතික වුණු බවද මෙහිදී සඳහන් කරන්න කැමැතියි. එවැනි පසුබිමක ඛනිජ තෙල් වෘත්තීය සමිති හදිසි වර්ජනයක් කැඳවීම අවාසනාවන්ත තත්ත්වයක්.

ගරු කථානායකතුමනි, වර්තමානයේ රට පුරා ඩෙංගු වසංගත තත්ත්වයක් පවතිනවා. මේ තත්ත්වයෙන් ජනතාව මුදා ගැනීම සඳහා සියලු පාර්ශ්ව එකට එක්ව ඩෙංගු මර්දන ව්‍යාපාරයකට සම්බන්ධ වී තිබෙනවා. රටේ සියලු විද්‍යුත් මාධ්‍ය ආයතන සිය තරගකාරිත්වය පසෙකලා ඩෙංගු මර්දන වැඩසටහන් සඳහා දායකත්වය ලබා දී තිබෙන්නේ රට වෙනුවෙන් යුතුකම් ඉටු කළ යුතු නිසායි. ඩෙංගු පාලනයට, වැළැක්වීමට සහ රෝගීන් සුවපත් කිරීමට පක්ෂ, පාට, ජාති, ආගම් ආදී සියලු භේද ඉවතලා රටේ බහුතර ජනතාව වෙහෙසවන අවස්ථාවකයි, "ශක්‍රයා එක්කවත් සාකච්ඡා කරන්නේ නැහැ" කියමින් ඛනිජ තෙල් වර්ජනය ක්‍රියාත්මක කරන්නේ.

ඛනිජ තෙල් බෙදා හැරීම අකර්මන්‍ය වුණොත් රටේම එදිනෙදා කටයුතු අඩපණ වෙනවා. රෝහල් සේවක-සේවිකාවන්ගේ ගමනාගමනය, ගිලන් රථ ධාවනය, ඩීසල් විදුලි ජනනය, පොදු ප්‍රවාහන සේවා ආදී සෞඛ්‍ය සේවාවලට සෘජුවම බලපාන ක්ෂේත්‍ර ගණනාවකට මේ වර්ජනය බලපානවා.

එසේම, කසළ කළමනාකරණය දැන් අපි ආරම්භ කරලා තිබෙනවා; කසළ ඉවත් කිරීම කර ගෙන යනවා. මේ ප්‍රශ්නය මාස දෙකක් තිබුණා. ඉන්ධන නොලැබීමෙන් කසළ ඉවත් කිරීම හා කසළ කළමනාකරණයට පහරක් වැදුණා නම්, ඒකෙනුත් වන්නේ ඩෙංගු උවදුර තවත් උග්‍ර වීමයි.

අනෙක් අතින් ගුවන් යානා ගමන් ඇනහිටීම, වරාය අංගනයවලට තෙල් නොමැතිවීම නිසා බහාලුම් කටයුතු නතර වීම ආර්ථිකයට බලපානවා. තවත් අතකින් සාමාන්‍ය ජන ජීවිතයට බාධා ඇති වෙනවා. හෙට අනිද්දා ආරම්භ වීමට නියමිත පාසල් විභාග කටයුතු අඩාල වෙනවා. ඊයේ රාත්‍රිය වන විට ඛනිජ තෙල් නීතිගත සංස්ථා පරිශ්‍ර තුළ යම් යම් ක්‍රියා සිදුවන බවට වාර්තා ලැබුණා. තෙල් බෙදා හැරීමට බාධාවන අයුරින් බවුසර් හරස් කිරීම, ඒවායේ හුළං ඇරීම, valves ගලවා වීසි කිරීම වැනි දේත් ඒ අතර සිදුවී තිබෙනවා. මීටත් වඩා බරපතළ ක්‍රියා සිදුවිය හැකි බවටත් තොරතුරු වාර්තා වුණා.

ඛනිජ තෙල් බෙදා හැරීම අත්‍යවශ්‍ය සේවාවක් ලෙස නම් කළේ මේ සියලු කරුණු ඉතා සැලකිල්ලෙන් අධ්‍යයනය කිරීමෙන්

පසුවයි. අත්‍යවශ්‍ය සේවා ගැසට් නිවේදනය නිකුත් කිරීමෙන් පසු, පරිශ්‍ර හා ඒවායේ ප්‍රවේශ මාර්ග ආරක්ෂා කරලීමේ කටයුතුවලට ආරක්ෂක හමුදා මැදිහත් වුණා. ඒ වාගේම, ඉන්ධන බෙදා හැරීමේ කාර්යයන්ට පූර්ණ ආරක්ෂාවක් සැපයීමේ වග කීමත් ඔවුන්ට පැවරුණා. අද දවල් වන විට සියලු කටයුතු යථා තත්ත්වයට පත් කෙරුණා. මේ වන විට ඉන්ධන බවුසර් පිටත් කරමින් පවතිනවා. ගුවන් යානා ඉන්ධන රැගත් දුම්රියද කටුනායක බලා යන්න සූදානම්. ඒ සියලු කටයුතු යථා තත්ත්වයට පත් වෙමින් පවතිනවා.

ගරු කථානායකතුමනි, අපි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ඉහළට ඔසවා තබනවා. අධිකරණයට හා නීතියට ගරු කරනවා. නමුත්, ඒවා විනාශ කරමින් රට අස්ථාවර කරන බලවේගවලට යටත් වෙන්නේ නැහැ. ඒ බලවේගවලට හිස නමන්නත් බැහැ.

ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුතු අපේ රජය හැම විටම රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් ක්‍රියා කරනවා. අප යහපත් දෙය අගය කරනවා; යහපත් දෙය ආරක්ෂා කරනවා; යහපත් දෙය වෙනුවෙන් පෙනී සිටිනවා. නමුත්, අයහපතට අපි ඉඩ දෙන්නේ නැහැ. අපි ජනතා යහපත වෙනුවෙන් යහපත් පිළිවෙතින් අයහපත් දේ යටපත් කරනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමා කැමැතිද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Okay.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමා කළ ප්‍රකාශයේ අසත්‍ය කරුණු කීපයක් තිබුණා. ඛනිජ තෙල් වෘත්තීය සමිති එකමුතුවේ කැඳවුම්කරු රාජකරුණා මහත්මයායි. ඔබතුමා කියපු මහත්මයා නොවෙයි, ගරු අගමැතිතුමනි. ඛනිජ තෙල් වෘත්තීය සමිති එකමුතුව කිසිසේත්ම සාකච්ඡා ප්‍රතික්ෂේප කර නැහැ. ඒක වැරැදි කථාවක්. දැනුත් ජනාධිපතිවරයා සමඟ කළ සාකච්ඡාවකින් පසුව එන විටදී කොලොන්නාවේදී වෘත්තීය සමිති නියෝජිතයන් කීපදෙනෙක් ඇතුළු 15දෙනෙක් පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන තිබෙනවා. [බාධා කිරීමක්] මේ දැන්, ගරු අගමැතිතුමනි. ඔබතුමා සොයා බලන්න. සාකච්ඡාවට ගිහින් එන විට පොලීසියෙන් පැහැරගෙන යනවා. ඒකයි තමුන්නාන්සේලාගේ මැදිහත්වීමේ ක්‍රියා මාර්ගය. ඔබතුමා කිව්වාට, හමුදාව යොදවලා කිසිදු තෙල් බවුසරයක් තෙල් සංස්ථාවෙන් පිටත් වෙලා නැහැ. වෘත්තීය සමිතිම එකඟතාවකට ආවා, අත්‍යවශ්‍ය සේවා සඳහා ඔවුන් තෙල් නිකුත් කරන්න සූදානම් බවට. උදාහරණයක් ගත්තොත්, ගුවන් සේවාව වෙනුවෙන්. ඒ වාගේම, ජාතික රෝහලේ කටයුතු ඇන හිටීමේ අනතුරකට මුහුණ දී තිබුණා. ඒ සඳහා තෙල් නිකුත් කරන්නත් ඔවුන් එකඟතාවකට එමින් තිබුණා. එවැනි එකඟතාවකට එමින් තිබියදී තමයි හමුදාව යොදවලා එහි හිටපු සේවකයන්ට පන්න පන්නා පහර දීලා තිබෙන්නේ. ගරු අගමැතිතුමනි, ඔබතුමා මේ බව දන්නවා. සමහර අයට පහර දුන්නා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කිරීමක් පමණක් කරන්න, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි. මේ අවස්ථාවේ විවාදයකට යන්න අමාරුයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම මේ කියන්නේ එතුමා කියපු කරුණුවල තිබෙන සාවද්‍ය කරුණු පිළිබඳවයි ගරු කථානායකතුමනි. මේ හමුදාව යෙදවීමක් නොවෙයි, සාමකාමී තත්ත්වයක්, දේපොළ ආරක්ෂා කිරීමේ තත්ත්වයක් ඇති කිරීම නොවෙයි එතැන කර තිබෙන්නේ. එතැන සිටි සේවකයන්ට පහර දී නෙරපා හැර තිබෙනවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා කියූ පරිදිම ඔවුන්ගේ යෝජනා මොනවාද? එකක්, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය පිළිබඳවයි. ඔබතුමා ජූලි මාසයේ 13වැනි දා සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ගැන ගත යුතු යෝජනා පිළිබඳ විධිමත් යෝජනාවලියක් ඔබතුමාට භාර දුන්නා, ගරු අගමැතිතුමනි. ඔබතුමා සමහර ඒවා ගැන ප්‍රශ්න කර සිටියා. ඒ ප්‍රශ්නවලටත් ඒ එකමුතුවේ නියෝජිත මහත්වරු කරුණු ඉදිරිපත් කර තිබුණා. ඒ නිසා ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය පිළිබඳ යම් එකඟතාවකට ඒමේ ඉඩකඩ නිර්මාණය වෙලා තිබුණා. අපි ඔබතුමාට ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, පිරිපහදුව නවීකරණය පිළිබඳ කාරණය අද ඊයේ තිබුණු සාකච්ඡාවක් නොවෙයි. පිරිපහදුව නවීකරණය කරන්න 2007දී මුල්ගල තැබුවා. එම පිරිපහදුව නවීකරණය කිරීමකින් තොරව අපේ රටේ ජනතාවට අඩු මිලට, සහන මිලට තෙල් ලබාදීමේ හැකියාවක් නැහැ. අද අපට අවශ්‍ය තෙල්වලින් විශාල ප්‍රමාණයක් සඳහා පිරිපහදු කරන ලද තෙල් ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඔවුන් එය කියන්නේ කුමක් වෙනුවෙන්ද? ජනතාවට සහන මිලට තෙල් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා, පිරිපහදුව නවීකරණය කළොත්. 1968 ඉඳන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ පිරිපහදුව නවීකරණය කිරීම පිළිබඳව කථා කරනවා. එයට විසඳුම් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, ඔබතුමා මේ ගැන- [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊළඟට තුන්වන ප්‍රධාන කරුණ වන්නේ වරාය පිළිබඳ ප්‍රශ්නයයි. ඔබතුමන්ලා ඊයේ ඒ සම්බන්ධයෙන් වන ගිවිසුම අත්සන් කළා. පැවැති රජය තෙල් ටැංකි ගොඩ නැඟීමට දුන්නේ වරාය අධිකාරියටයි. හැබැයි, වරාය අධිකාරිය වෙන කොහේවත් රටකට අයිති එකක් නොවෙයි. ඒක අයිති ශ්‍රී ලංකා ආණ්ඩුවටයි. වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයාත් ඉන්නේ කැබිනට් මණ්ඩලයේ. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයාත් ඉන්නේ කැබිනට් මණ්ඩලයේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉල්ලා සිටියේ අන් කවරක්වත් නොවෙයි. අපේ රටට වැඩිම ලාභ ලබා ගත හැකි ව්‍යාපාතිය බවට පත් වෙන්න නැව් තෙල් අංශය වර්ධනය කරන්න කියලායි ඉල්ලන්නේ. හම්බන්තොට වරාය ගැන අපි සිකුරාදා සාකච්ඡා කරමු. හැබැයි, නැව් තෙල් අංශය තමයි අපේ රටේ වැදගත්ම දේ.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු කථානායකතුමනි, ඔබතුමා විදුලි බල සහ බල ශක්ති අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ තමයි ඔබතුමා යටතේ තිබුණු මැරයින් සර්විස් ලිමිටඩ් ආයතනය ජෝන් කීල්ස් ආයතනයට විකුණුවේ. ඒ වෙලාවේත් වෘත්තීය සමිති කෑ ගැහුවා, මැරයින් සර්විස් ආයතනය විකුණන්න එපාය කියලා. හැබැයි, අද නැවත හම්බන්තොට වරායේ නැව්වලට තෙල් ගැසීමේ බලය තෙල් සංස්ථාවට ලබා දෙන්න කියලා කියන්නේ, තෙල් සංස්ථාවට වැඩිම ලාභ උපයා ගත හැකි පංගුව එය නිසයි. ඒ හරහා මේ රටේ ජනතාවට අඩු මිලට තෙල් ලබා දිය හැකිව තිබෙනවා. හැබැයි, නැව් තෙල් අංශයත් චීන රජයට පැවරීම තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය අනුමත කරන්න සූදානම් වෙනවා නම් ඒකට විරුද්ධව ඉක්මන් ක්‍රියාමාර්ගයක් හැටියටයි ඔය සටන් ක්‍රියා මාර්ගයට අවතීර්ණ වුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා මේ හැම ක්‍රියාවක්ම තෙල් සංස්ථාවත්, ආර්ථිකයත්, රටේ ජනතාවගේ උපයෝගීතාවත් වෙනුවෙන් කරන ගැටුම්. මේවා කිසිවක් වෘත්තීය සමිතිවලින් කරන්න ඕනෑ ඒවා නොවෙයි. පාලකයන් විසින් හොයා බලා විසඳුම් දෙන්න ඕනෑ කාරණායි. හැබැයි පාලකයන් විසඳුම් ලබා නොදෙන නිසා තමයි වෘත්තීය සමිතිවලට මැදිහත් වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා තමයි මේ රටේ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු අගමැතිතුමනි, ඔබතුමා එතුමාගේ ප්‍රශ්නයටත් ඉඩ දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය කෙටියෙන් අහන්න. කථාවක් නොවෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හදිසියේම මහජන ආරක්ෂක නිවේදනය ප්‍රකාශයට පත් කරමින් ඊයේ දිනයේ රජය කටයුතු කළ ආකාරය හා එයට හේතුව දක්වමින් ගරු අගමැතිතුමා කළ ප්‍රකාශය ගැන කාරණා කිහිපයක් පමණක් සැකෙවින් ඉදිරිපත් කරනවා, පිළිතුරු ලබාදෙයි කියලා බලාපොරොත්තුවෙන්. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් දැන් සඳහන් කළ පරිදි මේ පිළිබඳ තෙල් සංස්ථාවේ සේවකයන් හා වෘත්තීය සමිති රජයට කරුණු ඉදිරිපත් කළේ ඊයේ නොවෙයි; පෙරේදාත් නොවෙයි. පසුගිය මාසයට පෙරත් මේ කරුණු ඉදිරිපත් කළා. මේ පිළිබඳව අමාත්‍යවරයා හා සංස්ථාව ඉතා හොඳින් දන්නවා. මේ ප්‍රධාන කරුණු පිළිබඳව විසඳුමක් ඉල්ලා සිටින බව රජය දන්නවා. එයට විසඳුමක් ලබා නොදී සිටීමෙන් හා ඒ පිළිබඳ දැනට ගෙන තිබෙන ක්‍රියාමාර්ගය නිසයි මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි වේවා, හම්බන්තොට තෙල් ටැංකි වේවා, කොළඹ වරායේ තෙල් නළ මාර්ග සම්බන්ධයෙන් වේවා, ඒ පිළිබඳව ගත හැකි ඊළඟ ක්‍රියා මාර්ගය කුමක්ද?

ඊළඟ ක්‍රියා මාර්ගය තමයි, තමන්ගේ අයිතිවාසිකම් හා ආයතනය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩ වර්ජනයකට පිවිසීම. ආයතනය ආරක්ෂා කර ගැනීම සඳහා සේවකයන් ගෙන ඇති ක්‍රියා මාර්ගය ලෙස වැඩ වර්ජනයකට පිවිස තිබියදී ආණ්ඩුව විසින් මහජන ආරක්ෂක පනත ප්‍රකාශයට පත් කොට හමුදාව යවා ඔවුන් ලවා මේ කටයුතු කිරීමේ උත්සාහයක යෙදෙමින් සිටිනවා. ඊයේ රාත්‍රියේ ගත් එම උත්සාහය අසාර්ථකයි. ගරු අගමැතිතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. අගමැතිතුමා දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ ඇමැතිකම් සහ අගමැතිකම දරපු කෙනෙක්. ඒ නිසා ගරු අගමැතිතුමා මේ සම්බන්ධයෙන් දැනගන්න ඕනෑ. ගරු කථානායකතුමනි, හමුදාව නොදන්නා යම් බොත්තමක් එබුවොත් එතැන ඇති වෙන්නේ භයානක සිදුවීමක්.

අනෙක් කාරණය තමයි, එහෙම වුණොත් මිශ්‍ර ද්‍රව්‍ය නිකුත් වෙනවා. මම වග කීමෙන් කියනවා, එවැනි සිදුවීමක් අද උදේ වෙන්න ගිහිල්ලා නවත්වා තිබෙන බව. ඒ නිසා සේවකයන්ගේ සහයෝගය ලබාගෙන අත්‍යවශ්‍ය ආයතනවලට ලබාදීමට වෘත්තීය සමිති ගත්ත ක්‍රියා මාර්ගයට අනුව කටයුතු කරන්න. ඒ දුන්නු පොරොන්දුවෙන් බාහිරව කටයුතු කරන්න එපා.

දෙවැනි කාරණය, දැන් කොළඹ වරායත් මහජන ආරක්ෂක නීතිය යටතට ගෙනැල්ලා තිබෙනවා. හම්බන්තොට වරායත් මහජන ආරක්ෂක නීතිය යටතට ගෙනැල්ලා තිබෙනවා, තෙල් ටැංකි තිබෙන නිසා. මේක බරපතළ ක්‍රියා මාර්ගයක්. ඒ අතරතුර ඇමතිතුමා -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇයි strike කළේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අනේ! මේ තොත්ත බබා දන්නේ නැහැ නේ. මේ තොත්ත බබා දන්නේ නැහැ strike කළේ මොකද කියලා. ඉතින් මොනවා කියන්නද? ඔබතුමා තොත්ත බබා නේ. ඊට වඩා භයානකයි තෙල් ගිනි ගන්නවා. ඔය තොත්ත බබා දැනගන්න ඕනෑ, තෙල් කියන දේ ගිනි ගන්නා භයානක දෙයක් බව. - [බාධා කිරීම්] මට තව කාරණාවක් ගැන අගමැතිතුමාගෙන් අහන්න තිබෙනවා. හම්බන්තොට වරාය විකිණීම සඳහා කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තාය කියලා අගමැතිතුමා,- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු අගමැතිතුමා පිළිතුරු දෙයි. [බාධා කිරීම්] අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ඕනෑම වෘත්තීය සමිතියකට වෘත්තීය ක්‍රියා මාර්ග ගන්න අයිතියක් තිබෙනවා. හැබැයි, වැඩ කරන්න යන තවත් කණ්ඩායමක් බලහත්කාරයෙන් රඳවා ගන්නත්, ඒ යන අයට බිත්තර ප්‍රහාර එල්ල කරලා රටේ ජන ජීවිතය අකර්මණ්‍ය කරන්නත් කිසිදු වෘත්තීය සමිතියකට අයිතියක් නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මේ කරපු ප්‍රකාශය වැරැදියි. යුද හමුදාව ගියේ තෙල් බෙදා හරින්න නොවෙයි. යුද හමුදාව ගියේ තෙල් සංකීර්ණයේ ආරක්ෂාවටයි. නමුත් එක වෘත්තීය සමිතියක් ස්වේච්ඡාවෙන් වැඩ කරන්න යද්දී, - [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම අවස්ථාව දුන්නා නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව දෙන්න. එක වෘත්තීය සමිතියක් ස්වේච්ඡාවෙන් වැඩ කරන්න යද්දී, තවත් කණ්ඩායමක් බලහත්කාරයෙන් ඔවුන්ට කුණු බිත්තර ප්‍රහාර එල්ල කරනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ස්වේච්ඡාවෙන් වැඩ කරන සේවකයන් සිටිනවා. [බාධා කිරීම්] ඔවුන්ව නවත්වන්න තමයි මේ අය කටයුතු කරන්නේ. [බාධා කිරීම්]

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Namal Rajapaksa, what is your point of Order?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, කාරණා දෙකක් සම්බන්ධව පැහැදිලි කර ගන්න අවශ්‍යයි. ඊයේ, - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, ඔබතුමාගෙන් ප්‍රශ්න තුනක් ඇහුවා. ඔබතුමා පිළිතුරු දෙනවාද? [බාධා කිරීම්] Let the Hon. Prime Minister explain.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට කියන්න අවස්ථාව දෙන්න කෝ.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමා මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, සාකච්ඡාවට එන්නේ නැහැ කිව්වා නේ. නමුත් දැන් ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරන්න කියලා ගිහිල්ලා එනකොට 20දෙනෙකුව අත් අඩංගුවට ගෙන තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොහොම හොඳයි.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
නමුත් එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා කියනවා, යුද හමුදාව යැව්වේ ආරක්ෂාවට කියලා. අපේ ගරු අගමැතිතුමා කිව්වා, හමුදාව යැව්වේ තෙල් බෙදන්න කියලා. මේ දෙදෙනාගෙන් ඇත්ත කියන්නේ කවුද? ගරු අගමැතිතුමනි, අපට ඒ පිළිබඳ උත්තරයක් ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට දැන් මේ පිළිබඳව විවාදයකට යන්න අපහසුයි. ගරු අග්‍රාමාත්‍යතුමා, - [බාධා කිරීම්]මේ ගැන විවාදයක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. Let the Hon. Prime Minister give the reply.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙනවා නම් මම පිළිතුරු දෙන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු අගමැතිතුමාගෙන් තව එක කාරණයක් අහන්න අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can have a separate Debate on this later, but now let the Hon. Prime Minister make the Statement.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Not a debate, I want to ask a question.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
So, ask the question quickly.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමා අන්තිමට කිව්වා මෙය නීතිමය ප්‍රශ්නයක්, ඒ නීතිමය ප්‍රශ්නය ඉවරයි කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එහෙම කිව්වේ නැහැ. Let me explain what I said.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, okay. [බාධා කිරීම්] ස්ථාවර නියෝග අනුව Ministerial Statement එකක් සම්බන්ධයෙන් විවාදයක් කරන්න බැහැ. මම මන්ත්‍රීවරුන් තුන්දෙනෙකුට කථා කරන්න අවස්ථාව දුන්නා. දැන් ගරු අගමැතිතුමා පැහැදිලි කරයි. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැමෝටම අවස්ථාව දුන්නා. දවස පුරා මේ ගැන වාද කරන්න බැහැ. ගරු අගමැතිතුමා පැහැදිලි කරන්න. [බාධා කිරීම්] එතුමාටත් අවස්ථාව දුන්නා. මත ප්‍රකාශ කරන්න අවශ්‍ය හැමෝටම අවස්ථාව දුන්නා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලාටත් අවස්ථාව දුන්නා. අනෙකුත් පක්ෂවල මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව දුන්නා. මම තුන් හතර දෙනෙකුට අවස්ථාව දුන්නා.

ගරු අගමැතිතුමා. [බාධා කිරීම්]

Let the Hon. Prime Minister reply. [බාධා කිරීම්] ඔබතුමන්ලා ප්‍රශ්න හතරක්, පහක් ඇහුවා. ඔබතුමන්ලාගේ ප්‍රශ්නවලට ගරු අගමැතිතුමා පිළිතුරු දෙයි. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමාට පිළිතුරු දෙන්න ඔබතුමන්ලා ඉඩ දෙන්නේ නැහැ නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපට ප්‍රශ්න අහන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මිනිත්තු දහයක් තිස්සේ ප්‍රශ්න ඇහුවා නේ. [බාධා කිරීම්] මිනිත්තු පහක් තිස්සේ ප්‍රශ්න ඇහුවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇහුවේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න ඇහුවා. [බාධා කිරීම්] ප්‍රශ්න ගණනාවක් ඇහුවා. [බාධා කිරීම්] ගරු සභාවේ ඝෝෂා කරන්න එපා. ඔබතුමන්ලාට ප්‍රශ්න අහන්න ඉඩ දුන්නා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට දුන්නා; ඔබතුමාට දුන්නා; නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට දුන්නා. මේක විවාදයක් කර ගන්න දෙන්න බැහැ. [බාධා කිරීම්] පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්. ස්ථාවර නියෝග අනුව විවාද කරන්න දෙන්න බැහැ. ඒ බව තමුන්නාන්සේලා හැමෝම දන්නවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා පැහැදිලි කරන්න. ගරු මන්ත්‍රීවරුනි, මෙතුමා කැමැති නම් තව ප්‍රශ්න ගැන පැහැදිලි කිරීම් කරයි. ගරු සභාවේ වාඩි වෙලා, සාමකාමීව ප්‍රශ්න අහන්න. රණ්ඩු වෙන්නේ නැතුව ප්‍රශ්න අහන්න. ගරු අගමැතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න. ඔබතුමන්ලා මෙතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්නේ නැහැ නේ. [බාධා කිරීම්] ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ප්‍රශ්න අහන එකයි, පිළිතුරු දෙන එකයි දෙකම. දැන් තමුන්නාන්සේලාට ප්‍රශ්න අහන්න අවස්ථාව දුන්නා. මෙතුමා පිළිතුරු දෙන්න ලෑස්තියි. පිළිතුරු දෙන්න ඉඩ දෙන්නේ නැත්නම් මොකද කරන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා තීරණය ගන්නේ - [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමා වැරදි දෙයක්- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාට ප්‍රශ්න අහන්න අවස්ථාව දුන්නා. ඔබතුමා දීර්ඝ කථාවක් කළා නේ. ඔබතුමන්ලා ඔක්කෝම කළේ, දීර්ඝ කථා. [බාධා කිරීම්] ඉතින්, එතුමාටත් අයිතියක් තිබෙනවා. එතුමාට දුන්නේ මිනිත්තු දෙකයි. ඔබතුමාට මිනිත්තු හතක්, අටක් විතර දුන්නා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාටත් මිනිත්තු අටක් දුන්නා. තමුන්නාන්සේලා මට කොච්චර ඇඟිල්ල දික් කළත්, කොච්චර තර්ජනය කළත්, මම හුඟක් සාධාරණව කටයුතු කර තිබෙනවා. මම සාධාරණ විධියට වෙලාව දුන්නා. [බාධා කිරීම්] ඔව්, සාධාරණ විධියට වෙලාව දුන්නා. [බාධා කිරීම්] ගරු අගමැතිතුමනි, you may reply.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මින් අනතුරුව ගරු මුදල් ඇමතිතුමා නියමයන් කීපයක් ගරු සභාවට ඉදිරිපත් කරනවා. ඒ යටතේ ඕනෑ තරම් මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. පැය දෙක, තුනක් තිබෙනවා.

පළමුවෙන්ම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමයි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමයි මතු කළ කාරණා ගැන පිළිතුරු දෙන්න මට ඉඩ දෙන්න. මම ඉස්සෙල්ලාම කියන්න කැමැතියි, ඇයි මේක සිදු වුණේ කියලා. පළමුවැනි වතාවට ගරු සභාවට ඇවිල්ලා මම කරුණු කිව්වා. පසු ගිය පාලන කාලයේ නම්, මේ එකක්වත් ගැන කියන්නේ නැහැ. [බාධා කිරීම්] මේ එකක්වත් කියන්නේ නැහැ. [බාධා කිරීම්] ඇත්ත වශයෙන්ම රටේ අද තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය නිසා තමයි මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ ප්‍රකාශය කළේ.

මම ප්‍රකාශයක් කළේ නැත්නම් මෙහෙම නැඟිටලා කෑ ගහන්න බැහැ නේ. රාජකරුණා මැතිතුමා ගැන මම මෙතැන මොකක්වත් කියන්න ගියේ නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, බන්දුල සමන්කුමාර තමයි කියා තිබෙන්නේ, ඛනිජ තෙල් සංස්ථාවේ වෘත්තීය සමිතියේ කැඳවුම්කරු කියා. ඇත්ත වශයෙන්ම මටත් ඒක ප්‍රශ්නයක් වුණා. රාජකරුණා මැතිතුමා එක්ක අපි එකඟ නොවුණත් හොඳ කථාවක්, සාකච්ඡාවක් කරන්න පුළුවන් මහත්මයෙක්. ඒ ගැන මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] දැන් රාජකරුණා ගැන කථා කරනකොටත් කෑ ගහනවා. හරි වැඩක් වෙලා තියෙන්නේ. රාජකරුණා මැතිතුමාත් එක්ක මම එකඟ වෙන කාරණා නැහැ. එහෙත් අඩු ගණනේ මට එතුමා එක්ක කථා කරන්න පුළුවන්. මම කිව්වේ බන්දුල සමන්කුමාර ගැන. [බාධා කිරීමක්] මම දැන් මෙතුමාත් එක්ක කථා කරනවා නේ. මම කී දෙනෙක් එක්ක කථා කරන්නද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දැන් ඇත්තටම ජනාධිපතිවරයාත් එක්ක සාකච්ඡාවක් තිබුණා. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
(The Hon. Anura Dissanayake)

අපි වෙඩි තියන්න කියලා නැහැ කාටවත්. කාටවත් වෙඩි තියන්න කියලා නැහැ කාටවත්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

සාකච්ඡාවක් තියලා එකඟතාවකට ආවා. ඒ එකඟතාව තිබියදී තමයි අත් අඩංගුවට ගන්නේ. [ඝෝෂා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මේ වැලිවේරිය නොවෙයි, කොලොන්නාව. අපි වෙඩි තියන්නේ නැහැ, කාටවත්. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. නැත්නම් මට සභාවේ වැඩ කටයුතු තාවකාලිකව අත් හිටුවන්නට සිදු වෙනවා. [ඝෝෂා කිරීම්] කරුණාකර වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] මේ අවස්ථාවේදී සභාවේ වැඩ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 3.09ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 3.09 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 3.09 p.m. and then resumed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, අද දින ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍යාංශ නිවේදන ප්‍රකාශ කිරීමෙන් අනතුරුව එම නිවේදනවලින් පැන නැඟුණු කරුණු පිළිබඳව පැහැදිලි කර ගැනීම සඳහා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාටත්, අනුර දිසානායක මන්ත්‍රීතුමාටත්, අදාළ ප්‍රදේශය නියෝජනය කරන මරික්කාර් මන්ත්‍රීතුමාටත්, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාටත් පවතින ස්ථාවර නියෝගවලට අනුකූලව අග්‍රාමාත්‍යතුමාගේත් අනුමැතියට යටත්ව මවිසින් ප්‍රමාණවත් පරිදි කාලය ලබා දෙන ලදී. සමහර අවස්ථාවල මිනිත්තු 6ක් දුන්නා; සමහර අවස්ථාවල මිනිත්තු 7ක් දුන්නා. ඉන් අනතුරුව ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මතු කරන ලද කරුණු පිළිබඳව පැහැදිලි කිරීමට කටයුතු කළ අවස්ථාවේදී, එසේ කිරීමට ඉඩ නොදීම හේතුවෙන් පාර්ලිමේන්තුව තුළ නොසන්සුන්තාවක් පැන නැඟුණෙන් පාර්ලිමේන්තුව තාවකාලිකව අත් හිටුවීමට සිදු වුණා. කලින් නියම කර ගත් පරිදි පස් වරු 2.30ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් පවත්වන ලදී. එහිදී තීරණය කර ගත් පරිදි හෙට දිනයේදී පැවැත්වීමට නියමිත රජයේ කටයුතු වෙනුවට ජනාධිපතිවරයා විසින් අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ නිකුත් කරන ලද නියමය පිළිබඳව දවස පුරා විවාදයක් පැවැත්වීමට නියමිතය. ඒ අනුව සියලුම මන්ත්‍රීවරුන්ට අදාළ කාරණය සම්බන්ධයෙන් තම අදහස් හෙට දින විවාදයේදී ප්‍රකාශ කිරීමට අවස්ථාව තිබෙන බැවින්, අද දවසට නියමිත කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යෑමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මගෙන් අහපු කාරණයක් ගැන මා පැහැදිලි කරන්නම්. [බාධා කිරීම්] මට අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Let the Hon. Prime Minister explain. [බාධා කිරීම්] දැන් එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. ඊට පස්සේ ඔබතුමා කථා කරන්න. [බාධා කිරීම්] මෙය ගරු සභාවක් නිසා කථා කරන්න

[ගරු කථානායකතුමා]

අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] හෙට දවස පුරා විවාද කරන්න පුළුවන්. දැන් අග්‍රාමාත්‍යතුමා පැහැදිලි කරන්න ලෑස්තියි. [බාධා කිරීම්] එතුමාට පැහැදිලි කරන්න ඉඩ දීලා, එතුමා කැමැති නම් ප්‍රශ්නයක් අහන්න. මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්] ඔබතුමන්ලා මොකක්ද කරන්න කියන්නේ? [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, point of Order එකක් තිබෙනවා, - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, point of Order එක? Now, let the Hon. Prime Minister explain. [බාධා කිරීම්] අගමැතිතුමා පැහැදිලි කළාට පස්සේ අවශ්‍ය නම් එතුමාගේ කැමැත්ත අනුව තමුන්නාන්සේලාට පැහැදිලි කර ගන්න පුළුවන්. [බාධා කිරීම්] ඉතින් ඒක කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
We will not agree for a Debate tomorrow.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශයේ විවිධ කරුණු රාශියක් තිබෙනවා. ප්‍රශ්න 2, 3ක් අහන්න ඕනෑ නිසා එතුමා කිව්වා, ප්‍රශ්න අහන්න කියලා. මා ප්‍රශ්නය ඉදිරිපත් කරමින් ඉන්නකොට මගේ ප්‍රශ්න ඇසීම නවත්වා වෙන කෙනෙකුට ප්‍රශ්න ඇසීමට අවස්ථාව දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩි 7ක් පමණ දුන්නා. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විනාඩි 7ක් නොවෙයි. [බාධා කිරීම්] නැහැ. අගමැතිතුමා උත්තර දෙයි. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. කැමැති නම් උත්තර දෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉතින් මට ප්‍රශ්න අහන්න ඉඩ දෙන්න. ඔබතුමා නේ වළක්වන් නේ. ඔබතුමා වළක්වන්නේ ඇයි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා වළක්වන්නේ නැහැ. ඔබතුමා දැන් ප්‍රශ්නය අහන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇයි ඔබතුමා වළක්වන්නේ? ඔබතුමා වළක්වන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට දැන් ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙනවා. දැන් ප්‍රශ්නය අහන්න. ගරු අගමැතිතුමා උත්තර ලබාදෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විවාදයක් කිරීමේ කිසිදු වුවමනාවක් අපට නැහැ. අපට ඕනෑ විවාදයක් කරන්න නොවෙයි, ප්‍රශ්නයක් අහලා පැහැදිලි කර ගන්නයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මම කැමැතියි, පැහැදිලි කිරීමක් කරන්න. I would like to clarify one of the issues that-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්] අනෙක් අය වාඩි වෙන්න. [බාධා කිරීම්] දෙපැත්තේම අනෙක් මන්ත්‍රීවරු වාඩි වෙන්න. [බාධා කිරීමක්] හරි, ඒක මම කරන්නම්, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා, දැන් වැඩ ආරම්භ කරලා තිබෙනවා කියලා. දැන් තෙල් බෙදාහැරීම පටන් ගෙන තිබෙනවා කිව්වා. මේක අගමැතිතුමාව නොමඟ යවපු තොරතුරක් කියන එකයි අපි පළමුවෙන්ම කියන්නේ. වෘත්තීය සමිති සාකච්ඡා කරලා ආපසු පැමිණෙන විට ඒ සියලු දෙනාවම අත් අඩංගුවට ගෙන තිබෙනවා, ගරු අගමැතිතුමනි. දැන් ඒ අයව වැලිකඩ පොලිස් කූඩුවට අරගෙන ගිහින් තිබෙනවා. එතකොට ඔබතුමා කොහොමද කියන්නේ, වෘත්තීය සමිතිවලට නිදහස දෙනවා කියලා. දැන් කොලොන්නාවේ තෙල් ටැංකි ඉස්සරහා ඔවුන්ගේ ලේ හලනවා. මේක ඔබතුමා කථා කරමින් සිටිනකොට මතුවුණු ප්‍රශ්නයක්. මුළු ලෝකයටම මේ ප්‍රවෘත්තිය ගිහිල්ලා තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. එතුමාට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. ඊට පස්සේ ගරු අගමැතිතුමා පිළිතුරු දෙයි. මේ සභාව තුළ ප්‍රශ්න අහන්නත්, පිළිතුරු දෙන්නත් සෑම කෙනෙකුටම අයිතිය

තිබෙනවා. ඒ නිසා ඔබතුමා ප්‍රශ්නය අහන්න, අගමැතිතුමා පිළිතුරු දෙයි. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජනාධිපතිතුමාත් වෘත්තීය සමිති එක්ක සාකච්ඡාවක් කැඳවලා තිබෙනවා. වෘත්තීය සමිති නායකයන් පොලිස් අත් අඩංගුවට ගත්තාම ඒක සාධාරණ හා ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාවක් වෙන්නේ කොහොමද?

දෙවැනි කාරණය මෙයයි. අගමැතිතුමා කියන විධියට හමුදාව විතරයි ආරක්ෂාවට යවලා තිබෙන්නේ. නමුත් දැන් මැරයෝ දාලා ඒ මං සන්ධියේ දිගින් දිගටම පහර දෙමින් ලේ හලනවා. [බාධා කිරීම්] මේ වැඩ කරන ජනතාව,- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉඩ දෙන්න, අගමැතිතුමා පිළිතුරු දෙයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ වැඩ කරන ජනතාව. දේශපාලන පක්ෂවලට අයත් අය නොවෙයි. තෙල් සංස්ථාවේ වැඩ කරන සේවකයන්ගේ ලේ තමයි මේ හලන්නේ. [බාධා කිරීමක්] ඔව්. අගමැතිතුමනි, ඔබතුමන්ලා මේකට මැදිහත් විය යුතු බවයි අපි නැඟිටලා කියන්නේ. මේ වැඩේ නවත්වන්න. ලේ හලන එකයි, වෘත්තීය සමිති නායකයන් අත් අඩංගුවට ගැනීමයි නවත්වලා ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාවක් සඳහා එම සේවකයන්ට ඇති අයිතිය ලබා දෙන්න. ඔබතුමා ඒ පිළිබඳව පිළිතුරක් ලබා දෙන්න. ඒ වාගේම ඔබතුමා කිව්වා, අධිකරණ කටයුතු ඔක්කෝම ඉවරයි කියලා. [බාධා කිරීමක්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි,-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමා කියපු දේවල් දැන් ඔබතුමාට මතක නැහැ. මම මතක් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කිව්වා, "අධිකරණයේ කටයුතු ඉවරයි, ඒ නිසා දැන් මේ ගිවිසුම ක්‍රියාත්මක කරන්න පුළුවන්" කියලා.

අගමැතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ තවම විභාගයට ගන්නේ නැතිව නඩුවක් තිබෙනවා. ඒ තමයි, ආචාර්ය ලලිතසිරි ගුණරුවන් විසින් පවරන ලද නඩුව. එහෙමනම්, මේ ගිවිසුම් අත්සන් කිරීම නවත්වන්න. හම්බන්තොට වරාය විකිණීමට ඉඩ දෙන්න බැහැ. මේ නඩුව අහලා ඉවර වෙන්න ඕනෑ. ශ්‍රේෂ්ඨාධිකරණයට විරුද්ධව කැබිනට් මණ්ඩලය මෙවැනි හිතුවක්කාර තීරණයක් දෙන්නේ කොහොමද? ශ්‍රේෂ්ඨාධිකරණයට ගරු කරන්න ඕනෑ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයක් තිබෙන්න ඕනෑ. නඩු දෙකෙන් එක නඩුවක් අයින් කළා. අනෙක් නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තවම තිබෙනවා. අගමැතිතුමාව නොමඟ යවලා; කැබිනට් මණ්ඩලය නොමඟ යවලා. හම්බන්තොට වරාය විකිණීම පිළිබඳ නීතිවිරෝධී ගිවිසුමකට අගමැතිතුමාගේ ප්‍රකාශය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් අපි ගරු අගමැතිතුමාට අවස්ථාව දෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මම මගේ ප්‍රකාශයෙන් සඳහන් කළේ ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිළිබඳවයි. ඒවා බදු දීම පිළිබඳව දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාගයක් වෙමින් පවතිනවා. අපි සාකච්ඡාවේදී කිව්වේ, එම නඩු තීන්දුවෙන් අනතුරුව මෙහි ඇති නීත්‍යානුකූල තත්ත්වය තවත් පැහැදිලි වනවා කියලායි. මම හිතන්නේ, එම නඩු විභාගය වෙන්න තිබෙන්නේ සැප්තැම්බර් මාසයේයි. එම නඩුව ඉක්මනට අහලා අවසන් කරන්න අපිත් එකඟ වුණා. මම මෙතැන හම්බන්තොට වරාය සම්බන්ධ නඩුවක් ගැන කථා කළේ නැහැ. අපි කවුරුවත් අත් අඩංගුවේ තියන්න යන්නේ නැහැ. මේ සම්බන්ධව කටයුත්තර අරගෙන යවනවා. [බාධා කිරීම්] මට කථා කරන්න අවස්ථාව දෙන්න.

මීට ටික වේලාවකට ඉස්සෙල්ලා කොලොන්නාවේ තෙල් ගබඩාවේ ගේට්ටුව ළඟදී සිද්ධියක් ඇති වෙලා තිබෙනවා. සමහර අයට ඇතුළු වෙන්න ඉඩ දීලා නැති නිසා, water cannons එහෙම පාවිච්චි කරලා තිබෙනවා. මම සිද්ධිය ගැන සම්පූර්ණයෙන් විස්තර කියන්න යන්නේ නැහැ. මොකද, ඒ ගැන කටයුත්තර ගන්නා නිසා. කෙසේ හෝ එම සිද්ධිය ඇති වූ ස්ථානයෙන් පිරිසක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. පොලීසිය කිව්වා, හඳුනා ගත්ත අය ගෙනිහිල්ලා තිබෙනවා කියලා. ඒ අයගේ ප්‍රකාශ අරගෙන ඒ අයව ඉවත් කරනවා. කාගේවත් ලේ හැළිලා නැහැ. කාටවත් ලේ - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, පොඩ්ඩක් ඉන්න.[බාධා කිරීම්] අගමැතිතුමාට පැහැදිලි කරන්න ඉඩ දෙන්න.[බාධා කිරීම්] ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා වාඩි වෙන්න. එතුමාට පැහැදිලි කරන්න දෙන්න. ඉන් පසුව ඔබතුමන්ලාට අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මම මේ ගැන කිව්වාට පසුව හෙට මේ ගැන විවාද කරන්න පුළුවන්. ඊත් මෙහෙම කෑ ගහන්න ගියොත් අද තිබෙන වැඩ කටයුතු ටිකත් හෙට ගන්න වෙයි. ඔය දෙකම කරන්න බැහැ.

අනෙක අපි මෙතැන ලේ හළලා නැහැ. ඩෙංගු හැදුණු අයට මැරෙන්න අයිතිය දෙනවාද? ඒ අය මරන්න අයිතිය දෙනවාද? ලෙඩ වෙන අය මරන්න අයිතිය දෙනවාද? අන්න, ඒක කියන්න. මේ රටේ අද ඩෙංගු ප්‍රශ්නය තිබෙනවා. අපි ඒක විසඳන්න හදනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

දැන් ඩෙංගු ප්‍රශ්නයත් තිබෙද්දී, විශේෂයෙන්ම රෝහල්වල තිබෙන ජෙනරේටර් යන්ත්‍ර ක්‍රියාත්මක කර ගන්න බැරි නම්, වාහන ධාවනය කරන්න බැරි නම් මොකද වෙන්නේ? මෙතුමන්ලා කියන්නේ, ඩෙංගු රෝගීන් මරන්න ඕනෑ කියලාද? ඒ අයිතියද ඉල්ලන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි, ලජ්ජයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමන්ලා මට කියන්න, ඩෙංගු හැදුණු අය ගැන කටයුතු කරන්න අපට යුතුකමක් නැද්ද කියලා. මෙතැන කාරණා දෙකක් තිබෙනවා. තෙල් සංස්ථාවට අදාළ කාරණා දෙකම අපි කථා කරලායි තිබෙන්නේ. මේ තුන්වන එක තිබෙන්නේ, හම්බන්තොට වරායේ තෙල් ටැංකි ගැන. හම්බන්තොට වරායට තෙල් ටැංකි දමලා, ඒක වරාය සතුව තියෙන්න ඕනෑ කියලා තීරණය කරපු අය දැන් කෑ ගහලා වැඩක් නැහැ. එහෙම නම් එදා ඒක තෙල් සංස්ථාවට වෙන් කරලා දෙන්න තිබුණා. ඇමතිතුමා හෙට කියාවි, එතුමාට ගන්න තිබෙන තීරණ කුමක්ද, විශේෂයෙන්ම කොහොමද ඒ වැඩ කටයුතු කෙරෙන්නේ කියලා. ඒකට අපි අවස්ථාව දෙනවා. විශේෂයෙන්ම හෙට සහ අනිද්දා මේ සභාවේ විවාද තිබෙනවා. හෙට තිබෙනවා, මේ ගැන විවාදය. අනිද්දා විවාදය තිබෙනවා, හම්බන්තොට වරාය ගැන විවාදය. මේ කිසි දෙයක් ඇති වෙන්නේ නැහැ, සම්පූර්ණයෙන්ම හම්බන්තොට වරාය තෙල් සංස්ථාවට දුන්නා නම්. අපි 2003 වසරේදී යෝජනා කරපු හැටියට හම්බන්තොට වෙන් කළේ තෙල් පිරිපහදු කිහිපයක් ඇති කරන්න විතරයි. ඒ ජැටිය පාවිච්චි කරන්නේ තෙල් පිරිපහදුවලටයි, විශේෂයෙන්ම තාප විදුලි බලාගාරවලටයි. ඒක වෙනස් කරලා ඔබතුමන්ලා වරායක් ඇති කරලා, වරායේ තෙල් ටැංකි ටික වරාය අධිකාරියට දුන්නා නම්, එහෙම නම් ඒ අධිකාරිය සතුව තමයි අන්තිම තීරණය තිබෙන්නේ. දැන් මෙතැන කෑ ගහලා වැඩක් නැහැ. ඒ තිබෙන එක අපට ගලවන්න බැහැ. ඇමතිතුමා කියාවි, ඒකට එතුමා මොකක්ද කරන්නේ කියලා. එච්චරයි. ඉස්සර වෙලා මට කියන්න, තමුන්නාන්සේලා තෙල් ටැංකි වෙන් කළේ නැත්තේ ඇයි කියලා. ඇයි, ඒවා එදා දුන්නේ නැත්තේ? ඇයි, ඔය ටික එදා තෙල් සංස්ථාවට දුන්නේ නැත්තේ? ඇයි, කැබිනට් මණ්ඩලයෙන් ඉවත් වුණේ නැත්තේ? දැන් කෑ ගහන්න පුළුවන්. මේ එදා කැබිනට් මණ්ඩලයේ හිටපු සාමාජිකයෝ. තමුන්නාන්සේලා එකතු වෙලා කිව්වා, මේ ඔක්කෝම වරායට දමන්න කියලා, මේ ඔක්කෝම තිබෙන්නේ වරායේ කියලා. ඔබතුමන්ලා තමයි තීරණය ගත්තේ; අපි නොවෙයි. දැන් මේක කියතක් අරගෙන බෙදන්න බැහැ. එච්චරයි මම කියන්නේ. කියතක් අරගෙන වෙන් කරන්න බැහැ. කරපු අය මෙතැන කෑ ගහලා වැඩක් නැහැ.

මම මේකට අදාළ කාරණා ගැන කිව්වේ නැහැ. මම එක දෙයයි ඇහුවේ. ඔබතුමන්ලා කෑ ගහනවා. ඇයි, ඔබතුමන්ලා එහෙම නම් වෙන් කළේ නැත්තේ? ඇයි, තෙල් පිරිපහදුවට මේ කොටස කියලා වෙනම ණයක් අරගෙන, මේක අයිති වරායට කියලා වෙනම ණයක් අර ගත්තේ නැත්තේ? ඉතින් ඔය දෙකම කරන්නේ නැතුව - [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කැබිනට් මණ්ඩලයේ හිටියා. මට කියන්න, ඇයි එකඟ වුණේ නැත්තේ කියලා. මෙච්චර ණය ගන්නකොට කිව්වේ නැද්ද, තෙල් ටැංකි ටික වෙන් කරන්න කියලා? ඇයි කිව්වේ නැත්තේ, තෙල් ටැංකි ටික වෙන් කරන්න කියලා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමනි, ලේ හළන්නේ මොකද? මැරයෝ දමලා ගහන එක වහාම නවත්වන්න. මැරයෝ දමලා ගහන එක වහාම නවත්වන්න අගමැතිතුමාට පුළුවන්. ඒක කරන්න, පළමුවෙන්ම.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ජනතාව අහන්නේ, මේක වෙන් කළේ නැත්තේ ඇයි කියලායි. තෙල් පිරිපහදුවට මේ කොටසයි, මේ කොටස වරායටයි කියලා වෙන් කළේ නැත්තේ ඇයි? දැන් කෑ ගහලා වැඩක් නැහැ නේ. මම අහන්නේ එච්චරයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වෙන කතන්දරවලින් වැඩක් නැහැ. මේවා වෙන කතන්දර. ඇයි, මෙහෙම හැසිරෙන්නේ? මිනිස්සු ලේ හළාගෙන මහ පාරේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විමල් වීරවංශ මැතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද? හෙට දවස පුරාම විවාදයක් තිබෙනවා. ඒ නිසා අපි අද ප්‍රධාන කටයුතුවලට යන්න ඕනෑ. එහෙම නැත්නම් ඒක රටට කරන අසාධාරණයක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හරි, ගරු කථානායකතුමනි. මම ඔබතුමා කියන කාරණය ඉත සිතින් පිළිගන්නවා. මෙන්න මේ කාරණය විතරයි මට ඔබතුමාගේ අවධානයට ලක් කරන්න තිබෙන්නේ. මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරයට තමන්ගේ සම්පත් රැක ගන්න වැඩ වර්ජනයක් කරන්න අයිතියක් නැද්ද? ඒ වැඩ වර්ජනය කරන අයට මරික්කාර් කියලා මැරයෙකුගේ ගෝලයෝ ටික යවලා පහර දෙන්න අයිතිය තිබෙන්නේ කාටද? මරික්කාර් කියලා මැරයෙකුගේ ගෝලයෝ ටිකක් තමයි යවලා තිබෙන්නේ. ගහලා තිබෙන්නේ මරික්කාර් කියලා මැරයෙකුගේ ගෝලයෝ. තමුන්නාන්සේලා නැහැ කිව්වාට, තවම ගහනවා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමා හම්බන්තොට තෙල් ටැංකි ගැන කථා කළා.

ගරු අගමැතිතුමනි, ඒක කියතකින් වෙන් කරන්න දෙයක් නැහැ, තෙල් ටැංකි ටික තිබෙන්නේ පර්යන්තයේ එහා පැත්තේ. වතුරෙන් වෙන් වෙලායි තිබෙන්නේ. ඔබතුමාට ගිවිසුම්ගත කරලා ඒක විකුණා ගන්න ඕනෑ නම්, ඒක වෙනම කථාවක්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඇයි ඒක තෙල් සංස්ථාවට භාර දුන්නේ නැත්තේ? ඇයි, ඒවා එකට දමලා දැන් කෑ ගහන්නේ?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමනි, සේවකයින් ඉල්ලුවේ සාකච්ඡාවක්. ගරු කථානායකතුමනි, සාකච්ඡාවෙන් විසඳා ගන්නේ නැතුව මැරයෝ දමලා ගහනවා. ගරු අගමැතිතුමනි, මැරයෝ දමලා ගහන එක නම් ඔබතුමාගේ ප්‍රතිපත්තිය, එහෙම නම් ගිය ආණ්ඩුවට බැණලා වැඩක් වෙන්නේ නැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
China Exim Bank එකෙන් ණය අරගෙන ගියේ වරාය අධිකාරිය, වෙන කවුරුවත් නොවෙයි.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමනි, ඔබතුමන්ලා මේ වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කළා නම් ඔය ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි රජයක් විධියට මේ සුළු වෘත්තීය සමිතියක් වෙනුවෙන් නොවෙයි, රටේ බහුතර ජනතාව වෙනුවෙනුයි කටයුතු කරන්නේ.

ඒ නිසා රටේ ජනතාව වෙනුවෙන් මේ රජය ඉස්සරහට ඇවිල්ලා ගන්න ඕනෑ තීන්දු තීරණ ගන්නවා. [බාධා කිරීම්] ඒ නිසා කාටවත් මේ ආණ්ඩුව නටවන්න බැහැ. [ඝෝෂා කිරීම්] එක-එක්කෙනාට ඕනෑ විධියට ආණ්ඩුව හොල්ලන්නත් බැහැ; වට්ටන්නත් බැහැ. [බාධා කිරීම්] කවුරුහරි හිතාගෙන ඉන්නවා නම් මෙකෙන් වට්ටන්න, ඒ ගැන හිතන්න එපා. ඔය වීරවංශලා මේ රට ගිනි තිබ්බා. [බාධා කිරීම්] අදත් කරන්නේ ඒකයි; හෙටත් කරන්නේ ඒකයි. [ඝෝෂා කිරීම්]

***[මේ අවස්ථාවේදී මන්ත්‍රීවරු පිරිසක් සිය අසුන්වලින් නැඟී සිටියහ.]***
*[இச்சந்தர்ப்பத்தில் உறுப்பினர்களில் பலர் எழுந்து நின்றனர்]*
*[At this stage, some Members rose from their seats.]*

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
චීනයට සින්නක්කර දුන්නේ, එක ඉඩමක් විතරයි ලු. එය මේ බන්දුල ගුණවර්ධන කියනවා. රාජපක්ෂ ආණ්ඩුව චීනයට සින්නක්කර දුන්නේ එක ඉඩමක් විතරලු. ඒ ගොල්ලන් සින්නක්කර දීලා, දැන් අපි බදු දෙන්න යනකොට කෑ ගහනවා. එක ඉඩමක් විතරක් දුන්නාය කියලා පොදුවේ පිළිගෙන තිබෙනවා. බන්දුල ගුණවර්ධන මැතිතුමා කියනවා, චීනයට සින්නක්කර දුන්නේ එක ඉඩමක් විතර ලු. චීනයට ඉඩම් සින්නක්කර දුන්නාය කියලා මෙන්න පිළිගෙන. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අපි දවසේ ප්‍රධාන කටයුතුවලට යොමු වෙමු. හෙට දවස පුරාම වාද කරන්න පුළුවන්.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජිත හේරත් මැතිතුමා. [ඝෝෂා කිරීම්]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු අගමැතිතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. දැන් විසිදෙනෙකු අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ අය ගිහින් තිබෙන්නේ ගේට්ටුව අවහිර කරන්න නොවෙයි. ගරු දුමින්ද දිසානායක ඇමතිතුමා එක්ක සාකච්ඡාවට ගිහින් එනකොට තමයි අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ. [බාධා කිරීම්] ඒ නිසා ඔබතුමා මේ විසිදෙනා නිදහස් කිරීමට වහාම කටයුතු කරන්න. [බාධා කිරීම්] රතුපස්වල ඇති වුණු තත්ත්වයවත්, කටුනායක ඇති වුණු තත්ත්වයවත් එතැන නැවත ඇති කරන්න එපා. [බාධා කිරීම්] මේ විසිදෙනා නිදහස් කිරීමට වහාම කටයුතු කරන්න. ඒක තමයි හදිසි ප්‍රශ්නය. [ඝෝෂා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
කවුරුවත් තියා ගන්නේ නැහැ. [බාධා කිරීම්] කට උත්තර සටහන් කරගෙන පිට කරනවා. සිද්ධිය ගැන හෙට කථා කරන්න.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මේ, හැම පැත්තෙන්ම මට ලැබුණු කරුණු විතරයි. [බාධා කිරීම්] මන්ත්‍රීතුමනි, මොකක්ද වුණේ කියලා හෙට කථා කරන්න පුළුවන්. මම එකක් කියන්න කැමැතියි. හැම එක්කෙනාගෙන්ම කට උත්තර අරගෙන පිට කරනවා. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ? මෙතැනින් මෙම කටයුතු අවසන් කරමු. මේක අපි අද දවසේ වැඩ කටයුතුවලට කරන අසාධාරණයක්. [බාධා කිරීම්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ වේලාවේ බොහොම පැහැදිලිව තගාලා ඇවිල්ලා ගහනවා; පහර දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අගමැතිතුමා ඒ ගැන බලන්නම් කිව්වා නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අගමැතිතුමාට පුළුවන්, රට වෙනුවෙන් මේක නතර කරන්න. ලිච්චවි ක්‍රමය ගහන එක නොවෙයි නේ. [බාධා කිරීම්] මිනිස්සු දම්මලා ගහන්න එපා. ගෝන්වල සුනිල්ලා වාගේ මිනිස්සු ගෙනැල්ලා දැන් ගස්සන්නේ. [බාධා කිරීම්] මරික්කාර් ගස්සන්නේ; තගාලා ගස්සන්නේ. එපා, රටට මෙහෙම කරන්න. [බාධා කිරීම්] මේක තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදය; පොලිස් රාජ්‍යය.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි පළමුවැනි වතාවට මේ ගැන ප්‍රකාශයක් කළා. මෙතෙක් කල් රාජපක්ෂ ආණ්ඩුවෙන් කළේ නැහැ. හෙට වාද කරන්න. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, හෙට වාද කරමු. [ඝෝෂා කිරීම්] අපි දැන් ප්‍රධාන වැඩ කටයුතුවලට යමු. දවස පුරාම - [ඝෝෂා කිරීම්] නැත්නම් අසාධාරණයි. ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා - [ඝෝෂා කිරීම්] අද බාධා කළා. හෙට දවසේදී - [ඝෝෂා කිරීම්] මම මේ බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ, - [ඝෝෂා කිරීම්]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගජදීර මැතිතුමා, ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ? [ඝෝෂා කිරීම්] ඔබතුමාට මොකක්ද අහන්න තිබෙන්නේ? අපි ප්‍රධාන වැඩ කටයුතුවලට යොමු වෙන්න ඕනෑ. ඔබතුමාට අවස්ථාව දුන්නානේ. අගමැතිතුමා ඒකට අවශ්‍ය පියවර ගනියි.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි දවසේ වැඩ කටයුතුවලට යොමු වෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි. මේක අවසාන අවස්ථාව.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You go ahead and speak. මම අහගෙන තමයි ඉන්නේ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, දවසේ වැඩ කටයුතුවලට යන්න අපි ලැහැස්තියි; අපි සූදානම්. අපි ඒකට බාධා කරන්නේ නැහැ. නමුත් අත්‍යවශ්‍ය සේවා යොදවා වැඩ කරන පන්තිය මර්දනය කිරීමේ පළමු පියවර විධියට - [ඝෝෂා කිරීම්] මේ කරන ම්ලේච්ඡ ප්‍රහාරය වහාම නවත්වනවාද, නැද්ද කියන එක ගැන ගරු අගමැතිතුමා ප්‍රකාශයක් කරන්න ඕනෑ. [ඝෝෂා කිරීම්] ප්‍රකාශ කරලා මදි. [ඝෝෂා කිරීම්] ප්‍රකාශ කරලා මදි. ඒක නවත්වන්න වැඩ කටයුතු පටන් ගන්න. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි දවසේ වැඩ කටයුතුවලට යොමු වෙමු. [ඝෝෂා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි එහෙම නම් ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කරමු. මම රොෂේන් චානක ගැන කථා කරන්නේ නැහැ. අපි ප්‍රධාන වැඩ කටයුතු පටන් ගනිමු. [ඝෝෂා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු යටතේ යෝජනා අංක එකේ සිට හත දක්වා - [ඝෝෂා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එකේ සිට හය දක්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊට කලින් පනත් කෙටුම්පත් පිළිගැන්වීම තිබෙනවා. [ඝෝෂා කිරීම්]

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත
### மாகாண சபைத் தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம்
### PROVINCIAL COUNCILS ELECTIONS (AMENDMENT) BILL

"1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා විසිනි.***
***2017 අගෝස්තු 08වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் சார்பில் மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2017 ஆகஸ்ட் 08, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக்குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Lakshman Kiriella, on behalf of the Minister of Provincial Councils and Local Government; to be read a Second time upon Tuesday, 08th August, 2017 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමා. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media , I move Item I. We will pass it. -[*Interruption.*]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දවස පුරා මේ නියමයන්, යෝජනාව සහ පනත් කෙටුම්පත සාකච්ඡා කිරීමට තමුන්නාන්සේලාගේ සහයෝගය දෙන්න කැමැතිද? මම මේ තුන්වැනි වතාවටයි ඉල්ලන්නේ.[බාධා කිරීම්] මේක වැදගත් පනත් කෙටුම්පතක්. අනෙක් ප්‍රශ්නය හෙට දවස පුරාම විවාද කරන්න පුළුවන්. ඒ නිසා මේ වැඩ කටයුතු කරන්න ඉඩ දෙන්න. එහෙම නැත්නම් වෙනත් විධියකට රටේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසාන වතාවට මම දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමා ඊයේ පැහැදිලිව නියෝගයක් දුන්නා, මා ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රකාශයට අද පිළිතුරු දෙන්නය කියා. අද ගරු ඇමතිතුමා ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා ඒකට පිළිතුරු නොදී වෙනත් කටයුත්තකට යන්න බැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට පිළිතුරු ලබා දෙන්න කියන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ සභානායකතුමා කිසිම දෙයක් දන්නේ නැහැ. [බාධා කිරීම්] කිසිම දෙයක් දන්නේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වැඩ කරන්නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. ඔබතුමා අද ඒකට පිළිතුරු දෙන්නේ නැද්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පිළිතුරු දෙන්න වාතාවරණයක් තියෙන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි හෙට මේ ප්‍රශ්නය වාද විවාද කරමු. හෙට ඒක ඉදිරිපත් කරන්න. මෙය ජාතික වැදගත්කමකින් යුත් පනත් කෙටුම්පතක්

[ගරු කථානායකතුමා]

නිසා මම තමුන්නාන්සේලාට නැවත වරක් ආයාචනය කරනවා, මෙයට සහාය දෙන්නය කියා. නැත්නම් මේක මේ දේශයට කරන විරෝධතාවක් වෙනවා. මේක වාද විවාද කරන්න කැමැතිද? නැත්නම් මේක ගෙන යන්න බැහැ. මම නැවත වරක් අවස්ථාවක් දෙනවා, මේක වාද කරන්න. කැමැති නම් වාද කරන්න පුළුවන්. එහෙම නැත්නම් තමුන්නාන්සේලා - [බාධා කිරීම්]

## විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත: නියමය
## விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் : கட்டளை
## SPECIAL COMMODITY LEVY ACT: ORDER

### I

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 2012/16 of 28th March 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No.2012/17 of 28th March 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### III

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 2012/52 of 31st March 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### IV

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 2018/2 of 08th May 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### V

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 2019/21 of 19th May 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රේගු ආඥාපනත: යෝජනාව
## சுங்கக் கட்டளைச் சட்டம் : தீர்மானம்
## CUSTOMS ORDINANCE: RESOLUTION

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235) relating to Import Duties, which was presented on 20.06.2017, be approved.
(Gazette Extraordinary No. 2006/42 of 16th February 2017)
(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන ) පනත් කෙටුම්පත
# நாட்டைக் கட்டியெழுப்புதல் வரி ( திருத்தம்) சட்டமூலம்
# NATION BUILDING TAX (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, " පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." --[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல ]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Lakshman Kiriella ]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. SPEAKER in the Chair.]*

***1වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (2009 අංක 9 දරන පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.)
## வாசகம் 2.- (2009ஆம் ஆண்டின் 9ஆம் இலக்கச் சட்டத்துக்கான முதலாம் அட்டவணையைத் திருத்துதல். )
CLAUSE 2.- (*Amendment of the First Schedule to the Act, No. 9 of 2009.*)

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) " 2 වන පිටුවේ, 15 සිට 20 දක්වා වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ඇ) (xviආ) අයිතමයේ "එයාර් ලංකා කේටරින් සර්විසස් ලිමිටඩ්" යන වචන වෙනුවට, පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

'2017 අගෝස්තු මස 1වන දිනට පෙරාතුව වූ යම්, කාල පරිච්ඡේදයක් සඳහා එයාර් ලංකා කේටරින් සර්විසස් ලිමිටඩ් ' ";

(2) " 2 වන පිටුවේ, 32වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'මඟින් 2017 අගෝස්තු මස 1වන දිනට පෙරාතුව' ";

(3) "3වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'විදුලිබල සැපයීම' ":

(4) "3වන පිටුවේ, 22වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'විදුලිබල සැපයුම' ";

(5) " 4වන පිටුවේ, 7 වන සහ 8 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'එදිනට පසු නමුත් 2017 අගෝස්තු මස 1වන දිනට පෙරාතුව ඉදිකිරීම" ";

(6) " 4වන පිටුවේ, 12වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඇ) 2017 අගෝස්තු මස 1වන දින හෝ' ";

(7) "4වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' (අ) 2017 අගෝස්තු මස 1වන දිනට පෙර' ";

(8) "4වන පිටුවේ, 24වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' (ආ) 2017 අගෝස්තු මස 1 වන දින හෝ' ";

(9) "5 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අගෝස්තු මස 1වන දිනට පෙරාතුව' ";

(10) "5 වන පිටුවේ, 21වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(xxxviii) 2017 අගෝස්තු මස 1වන දිනට පෙර' ";

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සහ 4 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம், 4ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 3 and 4 ordered to stand part of the Bill.*

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් තුන් වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, " පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 3.35ට, 2017 ජූලි 07වන දින සභා සම්මතිය අනුව, 2017 ජූලි 27 වන බ්‍රහස්පතින්දා පූ.භා.10.30වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 3.35 மணிக்கு பாராளுமன்றம், அதனது 2017 யூலை 07ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2017 யூலை 27, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 3.35 p.m. until 10.30 a.m. on Thursday, 27th July, 2017, pursuant to the Resolution of Parliament of 07th July 2017.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.